

# ශ්‍රී ලංකා සංචරණය

## සමාලෝචිත වර්ෂය 2020

## ශ්‍රී ලංකා සංචරණය පිළිබඳ සමාලෝචිත වර්ෂය 2020 සැකෙවින්

- ගෝලීය කෝවිඩ් වසංගතය සහ එහි බලපෑම හේතුවෙන් 2020 වර්ශය සංචරක කර්මන්තය කෙරෙහි අභියෝගාත්මක වසරකි.
- ඉකුත් වසරේ සිදුවූ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුවද 2019 වසරේ දෙසැම්බර් - 2020 මාර්තු කාලය වන විට සංචාරක කර්මාන්තය ශක්තිමත් ලෙස නැවත ගොඩනැගෙමින් පැවතුනි.
- මෙම වසරේ මාර්තු මාසය වන විට සංචාරකයන්ගේ පැමිණීම 507,311 වන අතර, පෙර වසර වල සමස්ත සංචාරක පැමිණීම 2018 වසරේ මිලියන 2.3 සහ 2019 වසරේ මිලියන 1.9 විය.
- 2020 මාර්තු මාසයේ සිට මගී ගුවන් යානා සහ නැව් පැමිණීම නවතා දමන ලදී

## අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සෞභාග්‍යයේ දර්ශනයෙහි ප්‍රධාන ප්‍රතිපත්ති දහයක් අඩංගු වේ:

-
- ජාතික ආරක්ෂාවට ප්‍රමුඛතාවය
- මිත්‍රශීලී, නොබැඳි, විදේශ ප්‍රතිපත්තිය
- දූෂණයෙන් තොර පරිපාලනයක්
- ජනතාවගේ අභිමතයන් ඉටු කරන නව ව්‍යවස්ථාවක්
- ඵලදායී පුරවැසිභාවය සහ ශක්තිමත් මානව සම්පතක්
- ජනතා කේන්ද්‍රීය ආර්ථික සංවර්ධනය
- තාක්ෂණය පදනම් කරගත් සමාජයක්
- භෞතික සම්පත් සංවර්ධනය
- තිරසාර පාරිසරික කළමනාකරණය
  විනයගරුක, නීතිගරුක සහ වටිනාකම් පදනම් කරගත් සමාජයක්

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රධාන ප්‍රතිපත්ති දහය යටතේ සංචාරක ව්‍යාපාරය 17 වතාවක් සඳහන් කර ඇත:

-
- විදේශීය සංචාරකයින් සඳහා රටේ නව ආකර්ශනීය ස්ථාන හඳුනා ගැනීම
  සම්මන්ත්‍රණ, උත්සව, ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීමට පහසුකම් සැපයීම සහ සංචාරකයින්
- ආකර්ෂණය කරගැනීම
  සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ආයෝජන සහ වෙනත් පහසුකම්
- සැපයීම
- වඩාත් කාර්යක්ෂම ආගමන සහ විගමන ක්‍රියාවලීන් හඳුන්වා දීම
- අභ්‍යන්තර ගුවන් තොටුපළ නවීකරණය කිරීම.
- දිවයින පුරා සංචාරක සේවා මධ්‍යස්ථාන පිහිටුවීම
- ක්‍රියාවලින් විධිමත් කිරීම
- පුහුණු පාසල් පිහිටුවීම
  හෝටල් වෙන් කිරීම, ප්‍රවාහන, සංචාරක මාර්ගෝපදේශකයන් සහ දේශීය ගුවන් ටිකට්පත් වෙන්කරවා
- ගැනීම සඳහා මාර්ගගත පහසුකම් හඳුන්වා දීම
- සංචාරක කර්මාන්තයේ සේවක සංඛ්‍යාව මිලියනයක් දක්වා වැඩි කිරීම
- උපායමාර්ගික අලෙවිකරණය සහ ප්‍රචාරණය
- ඉහළ මට්ටමේ සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට සහාය වීම
- දේශීය කර්මාන්තකරුවන්ට සංචාරක කර්මාන්තයට සහාය වීම සඳහා පසුබිම සකස්කරදීම
- සංචාරක අංශයේ කම්කරු නීති සංශෝධනය කිරීම
  ගෘහ හා ප්‍රජා සංචාරක සේවා සංවර්ධනය, සංචාරකයන්ට සිදුවන හිරිහැර වැළැක්වීම සහ සංචාරකයින් සඳහා ආරක්ෂාව සහතික කිරීම සඳහා
- සංචාරක මාර්ගෝපදේශකයින් සහ රියදුරන් ලියාපදිංචි කිරීම, පුහුණු කිරීම සහ සහතික කිරීම
  සංචාරක පොලිස් සේවය සංවර්ධනය කිරීම

**ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රධාන ප්‍රතිපත්ති දහය සහ න්‍යාය පත්‍ර අයිතම 17 සැලකිල්ලට ගෙන අපගේ කාර්යයන් මෙහෙයවීම සඳහා කුළුණු දහයක් හඳුනාගෙන ඇත.**

- පළමු කුළුණ : ජනතා කේන්ද්‍රීය සංචාරක අංශය
- දෙවැනි කුළුණ : කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් සහ සංචාරක කර්මාන්තයේ ප්‍රමිති ඉහළ නැංවීම
- තුන් වැනි කුළුණ : තාක්ෂණය පදනම් කරගත් සංචාරක කර්මාන්තයක්
- හතර වන කුළුණ : සංචාරකයන් සඳහා ආරක්ෂිත සහ සුරක්ෂිත රටක්
- පස් වන කුළුණ : නෛතික හා නියාමන රාමුව
- සය වන කුළුණ : තිරසර හා පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය
- සත්වන කුළුණ : නව සංචාරක නිපැයුම් සකස් කිරීම සහ ප්‍රවර්ධනය
- අට වැනි කුළුණ : ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් ස්ථානගත කිරීම සහ ප්‍රවර්ධනය
- නව වැනි කුළුණ : යටිතල පහසුකම් හා සේවා
- දස වැනි කුළුණ : හවුල්කාරීත්වයන්

# 01

## පළමු කුළුණ:
## ජනතා කේන්ද්‍රීය සංචාරක අංශය






## කර්මාන්තයට ලබාදුන් සහාය

- සංචාරක ව්‍යාපාරවල නිෂ්පාදන හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය, නියාමනය, පහසුකම් සැපයීම සහ ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම යන මූලික කාර්යයන් සමඟ සංචාරක සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී. කෙසේ වෙතත්, සංකීර්ණ ක්‍රියා පටිපාටි, ප්‍රවේශ වීමේ ගැටළු සහ විවිධ අක්‍රමිකතා හේතුවෙන් වසර 50 ක් තිස්සේ ලියාපදිංචි වී ඇත්තේ ව්‍යාපාර 4,237 ක් පමණි. 2020 දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරන ලද අතර එම ක්‍රියාවලිය දැන් 100% ක් මාර්ගගතව ඇති අතර එමගින් ලියාපදිංචිය දැනටමත් 26% කින් 5,336 දක්වා ඉහළ ගොස් තිබේ.
- 2020 වන තෙක් කර්මාන්තයට ලබා දී ඇති සහන හා ප්‍රතිලාභ බොහෝ විට සංගම් කිහිපයක් නියෝජනය කරන විශාල ආයතන කෙරෙහි යොමු විය. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව, තාවකාලික ණය සහන සහ වෙනත් සහන විශාල පාර්ශවකරුවන්ට ප්‍රයෝජනවත් විය. කෙසේ වෙතත්, පශ්චාත් කෝවිඩ්-19 සමයේ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ පුහුණුව ලත් හා ලියාපදිංචි වී ඇති සහ අතීතයේ දී නොසලකා හරින ලද සංචාරක මාර්ගෝපදේශකයින් සහ සංචාරක රියදුරන් වැනි පාර්ශවකරුවන්ට ලබා දෙන සහන පුළුල් කිරීමට මූලික පියවර ගෙන තිබේ. මෙම අංශයට ස්ථිර රැකියාවක් නොමැති අතර, සේවක අර්ථසාධක අරමුදල් හෝ සේවක භාරකාර අරමුදල් ප්‍රතිලාභ, විශ්‍රාම වැටුපක් හෝ ආරක්ෂිත ජාලයක් නොමැත. ඔවුන්ගේ අවම වැටුප වැඩි කිරීමට සහ ඔවුන්ගේ පුහුණුව ගෝලීය හොඳම භාවිතයන්ට අනුකූල වන පරිදි වැඩි දියුණු කිරීමට උත්සාහ දරමින් සිටී.
- 2020 වන තෙක් පළාත් මාර්ගෝපදේශයන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර නොතිබූ අතර, ඒවා නොසලකා හැර තිබිණි. කෝවිඩ්- 19 පසු පළාත් සභා වල සහාය ඇතිව පළාත් මාර්ගෝපදේශ ලියාපදිංචි කර ඔවුන්ට ලබා දීමට අපි පියවර ගෙන ඇත්තෙමු. ඒ අනුව ලියාපදිංචියෙන් පසුව ඔවුනට එක් වරක් පමණක් වන රු. 15,000ක කෝවිඩ් සහන දීමනාව ගෙවනු ලැබේ.
- සංචාරක රියදුරන්ට ඔවුන් ජීවත් වන ප්‍රදේශ වලදීම පහසු සහ ලාභදායී පුහුණුව ලබා දීමට වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) සමඟ හවුල්කාරිත්වයකට එළඹ ඇත. එමගින් දිවයින පුරා විසිරුනු පුහුණු මධ්‍යස්ථාන හරහා පාඨමාලා පවත්වනු ලැබේ.
- සංචාරක කර්මාන්තය ප්‍රථම වතාවට අපනයන කර්මාන්තයක් ලෙස හඳුනාගෙන ඇති අතර එමගින් වැට් බදු නිදහස් සහනයක් ලබා දී ඇත. රු. 50,000 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සඳහා වන මිළදී ගැනීම් සඳහා වැට් බදු ආපසු ගෙවීම හරහා කොළඹ හෝටල්කරුවන්ගේ සහ වෙළෙඳුන්ගේ ව්‍යාපාර දියුණුවට සහාය වනු ඇත. වැට් බදු ආපසු ගෙවීමේ යාන්ත්‍රණය මගින් සංචාරක කර්මාන්තයට අපකීර්තියක් ගෙන දෙන කොමිස් මුදල් ලබා ගැනීම සහ වෙනත් අක්‍රමිකතා තවදුරටත් ඉවත් කරනු ඇත.

## සංචාරක මාර්ගෝපදේශකයින් සඳහා සහන

සංචාරක මාර්ගෝපදේශකයින් 2,026ක් සඳහා රු. 20,000ක කෝවිඩ් සහන දීමනාව ගෙවා ඇත. එහි එකතුව රු. මිලියන 40.52කි. මෙයට ජාතික මාර්ගෝපදේශකයින් 1,062ක්, රියදුරු මාර්ගෝපදේශකයින් 135ක්, අඩවි මාර්ගෝපදේශකයින් 27ක් ඇතුලත් වේ.

## සංචාරක රියදුරන් සඳහා සහන

| | රියදුරු කාණ්ඩය | 2020.08.31 දිනට ලැබී තිබූ අයදුම්පත් සංඛ්‍යාව | සුදුසුකම් තහවුරු කළ සංඛ්‍යාව | සුදුසුකම්ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | පූර්ණ කාලීන සංචාරක රියදුරන් | 2,617 | 1,899 | 738 කට සෘජු ප්‍රේෂණ මගින් මුදල් යවා ඇත |
| 02 | සංචාරක බස්රථ රියදුරන් සහ සහායකයින් | 45 | 45 | ගෙවීම් කිරීමට සූදානම් කර ඇත |
| 03 | සංචාරක ත්‍රීරෝද රථ රියදුරන් | 658 | 658 | ගෙවීම් කිරීමට සූදානම් කර ඇත |
| 04 | සෆාරි රියදුරන් | 634 | 559 | ගෙවීම් කිරීමට සූදානම් කර ඇත |
| | සං.සං.අධි. යටතේ පුහුණුව ලබා නොදුන් ලියාපදිංචි නොවූ සංචාරක රියදුරන් | 359 | 359 | වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ පුහුණු කෙරේ |
| එකතුව | | **4,313** | **3,161** | |

## පළාත් සහා සංචාරක මාර්ගෝපදේශකයන්ට සහන ලබාදීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය

| | පළාත | ලියාපදිංචිය සඳහා සුදුසුකම්ලත් සංඛ්‍යාව | ලියාපදිංචිය සඳහා අයදුම්කල සංඛ්‍යාව | ලියාපදිංචිය සිදුකල සංඛ්‍යාව | මුදල් ලබාදුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | මධ්‍යම | 542 | 225 | 166 | |
| 02 | උතුරු මැද | 225 | 73 | 22 | |
| 03 | ඌව | 70 | 26 | - | 123 |
| 04 | බස්නාහිර | 237 | 1 | - | |
| 05 | දකුණ | 237 | 1 | - | |
| 06 | වයඹ | සියල්ලන්ම ලියාපදිංචිවී ඇති අතර මුදල් ගෙවා ඇත | | | |
| 07 | උතුර | | | | |
| 08 | නැගෙනහිර | කිසිදු තොරතුරක් මේ වනතෙක් ලබාදී නොමැත | | | |
| 09 | සබරගමුව | | | | |
| එකතුව | | **1853** | **326** | **188** | **123** |

# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය ලත් සංචාරක වාසස්ථානවල ජල සහ විදුලි බිල්පත් ගෙවීමට ලබාදී ඇති සහනය පිළිබඳ සියලු තොරතුරු

ලියාපදිංචිය ලත් සංචාරක ආයතන සඳහා කිසිදු විසන්ධි කිරීමකින් තොරව සමුච්ඡිත විදුලි බිල්පත් ගෙවීමට මාස 12ක සහන කාලයක් 2021 මාර්තු 1 සිට ලබා දී ඇත. සමුච්චිත ජල බිල්පත් ගෙවීමටද සහන කාලයක් ඉල්ලා ඇත.

## දැනට අවසන්ව ඇති කටයුතු

- සංචාරක කර්මාන්තයට වැට් බදු සහනය ලබාදීම
- සංචාරක කර්මාන්තය සඳහා ලබාගත් ණය හා ලීසිං ආපසු ගෙවීම සඳහා 2021 සැප්තැම්බර් 30 දක්වා කාලය ලබා දීම
- සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු සඳහා වසරක සහන කාලයක් ලබා දීම
- සංචාරක හෝටල්, ආපනශාලා, සංචාර සංවිධානය කරන සමාගම් ඇතුළු සේවා සපයන්නන් සඳහා තාවකාලික ලියාපදිංචි ගාස්තුව අඩු කිරීම
- සංචාරක සේවා සපයන ආයතන සඳහා මාස 6 ක සමුච්චිත විදුලි, ජල බිල්පත් ගෙවීම සඳහා වසරක සහන කාලයක්
- වෘත්තීය පුහුණු අධිකාරිය හරහා ප්‍රාදේශීයව වෙසෙන සංචාරක රියදුරන් පුහුණු කර ලියාපදිංචි කිරීම සඳහා කටයුතු කිරීම
- අවිධිමත් අංශය විධිමත් කිරීම සඳහා ප්‍රාදේශීය අංශ හා සම්බන්ධීකරණය කරමින් පුහුණු වැඩසටහන්, මාර්ගගත ක්‍රමය හඳුන්වා දීම, ලියාපදිංචි ගාස්තු අඩු කිරීම වැනි විවිධ පියවර ගනු ලැබීය
- සංචාරක කර්මාන්තය ඇතුළු කෝවිඩ් වසංගතයෙන් හානියට පත් කර්මාන්ත සඳහා රු. බිලියන 150ක ණය පහසුකම් ලබා දීම
- කර්මාන්තය නගා සිටුවීම සඳහා සංචාරකයන්ට දොරටු වැසී ඇති මොහොතක නිරෝධායන හෝටල් සහ නාවිකයන් හට හෝටල් සැපයීමේ අවස්ථාව ලබා දෙන ලදී
- 2021 වසර සඳහා සංචාරක කර්මාන්තය වෙනුවෙන් ලබා දී ඇති මත්පැන් බලපත්‍ර මුදල් අය කර ගැනීමකින් තොරව දීර්ඝ කිරීම

## සිදු කරගෙන යනු ලබන කටයුතු

- සංචාරක කර්මාන්තයේ නියැළි කුඩා හා මධ්‍ය පරිමාණ අංශයේ පුද්ගලයන් වෙනුවෙන් සමාජ ආරක්ෂණ වැඩසටහනක් හඳුන්වා දීම
- සංචාරක හෝටල්, ආපනශාලා සහ සංචාර සංවිධානය කරන සමාගම් වල සේවක පිරිසගේ වැටුප් ගෙවීම සඳහා සහන ණය වැඩසටහනක් හඳුන්වා දීම
- සංචාරක කර්මාන්තයට අයහපත් බලපෑම් ඇතිකරන විෂම වූ පළාත් පාලන බදු ක්‍රමය ඉවත් කොට ක්ෂේත්‍රයේ ප්‍රගමනය හරහා රටේ ආර්ථිකය නංවාලිය හැකි වන බදු ක්‍රමයක් හඳුන්වා දීම
- සංචාරක හෝටල් සඳහා විදුලි ඒකක මිළ (විශේෂයෙන්ම වැඩි ඉල්ලුමක් ඇති කාල පරාසයේදී - peak-hours) වෙනත් අපනයන කර්මාන්ත සමඟ සමාන මට්ටමට ගෙන ඒම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ සහාය ලබා ගැනීමට කටයුතු කිරීම.
- සූර්ය බලශක්ති ජනනය සඳහා දැනට 50KVA උපරිමයකට යටත්ව ලබා දෙන පුනර්ජනනීය බලශක්තිය සඳහා පවතින සහන මූල්‍යකරණය 300 KVA දක්වා වැඩි කිරීමට කටයුතු කිරීම
- දකුණු අප්‍රිකාව, තායිලන්තය සහ ඕස්ට්‍රේලියානු වැනි ගමනාන්ත සමඟ කරට කර තරඟ කළ හැකි වන පරිදි, ඕස්ට්‍රේලියානු නිපුණතා සංවර්ධනයේ සහාය ඇතිව සංචාරක මාර්ගෝපදේශකයන් සඳහා වන විෂය නිර්දේශය වැඩි දියුණු කිරීම
- ව්‍යවසායකත්වය වැඩිදියුණු කිරීම සඳහා සංචාරක මාර්ගෝපදේශ පුහුණුවට ඉංග්‍රීසි සහ ඩිජිටල් අලෙවිකරණ අංශය ඇතුළත් කිරීමට කටයුතු කිරීම
- ජාත්‍යන්තර සංචාරකයන් සමඟ සමීපව කටයුතු කරන කර්මාන්තයේ තානාපතිවරුන් වැනි වූ සංචාරක මාර්ගෝපදේශක වරුන්ගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා ඔවුන්ගේ අවම වැටුප වැඩි කිරීමට කටයුතු කිරීම

- වෙනත් දේශීය සේවා සපයන්නන් සමඟ සම මට්ටමේ තරඟකාරිත්වයක් සහතික කිරීම සඳහා මාර්ගගත සංචාරක නියෝජිතයින්ගෙන් (Online Travel Agents-OTAs) 1% සංචාරක සංවර්ධන බද්දක් අය කිරීම
- විවිධ සංචාරක සේවා සපයන්නන් (මාර්ගෝපදේශකයින්, සංචාරක කිමිදුම්කරුවන්, ටුක් ටුක් සහ අනෙකුත් සංචාරක රියදුරන්, වනජීවී සෆාරි රියදුරන්) පහසුවෙන් හඳුනාගැනීම සඳහා වර්ණ කේත කරන ලද (Colour coded) කාඩ්පතක් හඳුන්වා දීම

# විදේශීය සංචාරකයන් සඳහා රට නැවත විවෘත කිරීම සඳහා ක්‍රමවේදය (ප්‍රොටෝකෝලය) සහ සූදානම

## දැනට අවසන්ව ඇති කටයුතු

- සවිස්තරාත්මක කෝවිඩ්- 19 සෞඛ්‍යාරක්ෂක උපදේශන මාලාවක් පිළියෙල කොට හඳුන්වා දීම
- ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය විසින් ක්‍රියාත්මක කරන ලද සෞඛ්‍යාරක්ෂක ක්‍රමවේදය අගය කරමින් ලෝක සංචාරණ හා සංචාරක කවුන්සිලයෙන් ආරක්ෂිත සංචාරක මුද්‍රාව ශ්‍රී ලංකාවට ප්‍රදානය කෙරිණි
- සෞඛ්‍යාරක්ෂිත බව සහ සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා සවිස්තරාත්මක විගණන පැවැත්වීම සඳහා KPMG ස්වාධීන විගණන සමාගම තෝරා පත් කරන ලදී. පළමු අවස්ථාවේදී මෙම විගණනය සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ වියදමින් සිදුකරනු ලැබේ. මෙම සහතිකයෙහි QR කේතයක් ඇතුළත් වන අතර එමඟින් අමුත්තන්ට ඔවුන්ගේ හෝටලය විසින් ඉහත සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් අනුගමනය කරනු ලබන්නේද යන්න සහ ඒ පිළිබඳ ගැටළුවක් ඇත්නම් නියාමන අධිකාරිය දැනුවත් කිරීමේ අවස්ථාව ලබා දේ.
- ඕස්ට්‍රේලියානු රජයේ සහයෙන් S4IG ආයතනය හා එක්ව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වසංගත හා ආපදා සඳහා සූදානම පිළිබඳ පාඨමාලා පවත්වන ලදී
- කෝවිඩ්-19 සෞඛ්‍යාරක්ෂක උපදේශන මාලාව සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු රජයේ සහයෙන් MDF ආයතනය සහ ශ්‍රී ලංකා හෝටල් සංගමය හා එක්ව සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන් වෙත පුහුණුව ලබා දීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වසංගත හා ආපදා පිළිබඳ සූදානම සම්බන්ධ වැඩසටහන් ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව සැලසුම් කර සකස් කරන ලදී.

## සිදු කරගෙන යනු ලබන කටයුතු

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වසංගත හා ආපදා පිළිබඳ සූදානම සම්බන්ධ වැඩසටහන් සඳහා පුහුණුකරුවන් සූදානම් කර ඇති අතර ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහය ලබාගැනීමට සාකච්ඡා සිදුකරමින් පවතී
- ගුවන් තොටුපළ විදේශීය සංචාරකයන් සඳහා නැවත විවෘත කිරීමේ ක්‍රමවේදය පිළිබඳ කෙටුම්පත, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නායකත්වය යටතේ සකස් කිරීම අවසාන අදියරේ පවතී.
- විදේශීය සංචාරකයන්ට කෝවිඩ්-19 රෝහල්ගතකිරීම, නිරෝධායනය සහ අනෙකුත් වියදම් ඇතුළත් රක්ෂණාවරණයක් ලබා දීම දැනට ප්‍රසම්පාදන අදියරේ ඇත.
- විවිධ ප්‍රධාන මාර්ගෝපදේශ නිවැරදිව ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න නිරූපණය කිරීම සඳහා කෙටි වීඩියෝපට GIZ ආධාර යටතේ නිර්මාණය වෙමින් පවතී



## කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලියාපදිංචි කිරීම වැඩි කිරීම

පසුගිය වසර 30 ක පමණ කාලය තුළ අවිධිමත් සංචාරක කර්මාන්තය ශීඝ්‍ර ලෙස වර්ධනය වී ඇති අතර, මෙවැනි අවිධිමත් නවාතැන් සපයන්නන් අධික සංඛ්‍යාවක් සිටින බවට ගණන් බලා ඇත. කෙසේ වුවද, මෙතෙක් කලක් විවිධ හේතූන් නිසා මෙම අවිධිමත් අංශය ලියාපදිංචි කිරීමට නොහැකි වී තිබේ. එසේ වුවද, අවිධිමත් අංශය සංචාරක ක්ෂේත්‍රයට සහ සමස්ත ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. කෙසේ වෙතත්, ලියාපදිංචි නොකිරීම හේතුවෙන්, වසංගතයක් හෝ එවැනි අර්බුදයක් ඇති වූ විට, මෙම කොටසට කිසිදු සහනයක් ලබා ගැනීමට අයිතිවාසිකමක් හිමි නොවේ.

ලියාපදිංචි වීම පහසු කිරීම, එහි කාර්යක්ෂමතාව වැඩි කිරීම, පිරිවැය අඩු කිරීම සහ අක්‍රමිකතා තුරන් කිරීම සඳහා ලියාපදිංචි කටයුතු සියල්ල දැන් මාර්ගගතව (Online) සිදුකිරීමේ පහසුකම සපයා ඇත.

## දැනට අවසන්ව ඇති කටයුතු

- 100% මාර්ගගත ලියාපදිංචිය
- අවිධිමත් අංශ ලියාපදිංචි කිරීම 26% වැඩි කිරීම
- වත්මන් කර්මාන්ත අවශ්‍යතා සපුරාලීම සඳහා ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය සහ ඒ සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා සමාලෝචනය කර යාවත්කාලීන කිරීම

## දිවයින පුරා සේවා මධ්‍යස්ථාන

පළාත්සභා, පළාත් පාලන ආයතන සහ ප්‍රාදේශීය සංගම් සමඟ සමීප සහයෝගයෙන් කටයුතු කිරීම.

සේවා මධ්‍යස්ථාන විවෘත කිරීම සඳහා ස්ථාන කිහිපයක් හඳුනාගෙන ඇත. මෙමගින්;

- නීතිමය බාධක අභිබවා ලියාපදිංචි වීමට අවිධිමත් අංශයට සහායවීම
- සංචාරක ව්‍යාපාරයට සහාය වීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හඳුනා ගැනීම
- පුළුල් ප්‍රජා ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා පළාත් මට්ටමේ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම
- ලියාපදිංචි ආයතනවලට සහාය වීම
- ජාත්‍යන්තර හා දේශීය සංචාරකයින් සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම යනාදිය සිදු කෙරෙනු ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේහි සේවකයින් සේවා මධ්‍යස්ථාන වෙත අනුයුක්ත කෙරේ. වත්මන් සේවක සංඛ්‍යාව වැඩි නොවන අතර සමස්ත පිරිවැය කළමනාකරණය කරනු ලැබේ.

## සිදු කරගෙන යනු ලබන කටයුතු

- ඇල්ල සහ දඹුල්ල ඇතුළු ස්ථානයන්හි ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථාන පිහිටුවීම

## කර්මාන්තයේ පාර්ශවකරුවන් සමග වඩා සමීප කතිකාවතක්

## දැනට අවසන්ව ඇති කටයුතු

- සංචාරක කර්මාන්තය ආශ්‍රිත සංගම් 52 ක් සමඟ විවිධ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා සහ සංවාද පවත්වා ඇත
- සංචාරක පොලිස් ස්ථාන පිහිටුවීමේ අවශ්‍යතාව පිළිබඳ සමීක්ෂණය සඳහා කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය
- හෝටල් වර්ගීකරණය සහ ඒ සඳහා භාවිත කරන නිර්ණායක පිළිබඳව සමීක්ෂණයක් හරහා කර්මාන්තයේ සාමාජිකයන්ගේ අදහස් ලබා ගන්නා ලදී
- ක්ෂේත්‍රයේ සිටින කුඩාම ව්‍යවසායකයාට පවා සෘජුව ඉහළ කළමනාකරණය වෙත සිය ගැටළු යොමු කිරීමේ අවස්ථාව ලබා දී ඇත

## හෝටල් පාසල හරහා දැනට ලබා දෙන්නා වූ වසර 4ක් වන ඩිප්ලෝමා පාඨමාලාව උපාධි පාඨමාලාවක් බවට පත් කිරීම

වර්තමාන ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීමට වසර හතරක් ගතවන අතර එය උපාධියකට පරිවර්තනය කිරීමට කටයුතු කරමින් පවතී.ඊට අමතරව, විෂය නිර්දේශය වැඩිදියුණු කිරීමට සහ සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සමත් සිසුන්ට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය තුලින් සංචාරක කර්මාන්තයට පිවිසීමට අවස්ථාව සලසා දීමට කටයුතු සිදුකෙරෙමින් පවතී.

තවද ප්‍රායෝගික සහ වර්තමාන අවශ්‍යතාවන්ට අනුකූල කෙටි පාඨමාලා සහ ආරම්භක කඳවුරු ශෛලියේ වැඩසටහන් සකස් කර ඇත. මෙමගින් පවතින සම්පත් භාවිතා කරමින් වැඩි පිරිසක් පුහුණු කිරීමටද ඉඩ ලැබේ.

## සිදු කරගෙන යනු ලබන කටයුතු

- ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව උපාධි තත්ත්වය ළඟා කර ගැනීම සඳහා විෂය නිර්දේශය සහ ගැටළු විශ්ලේෂණය කිරීම
- ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ සහාය ඇතිව ජාත්‍යන්තරය සමග සංසන්දනාත්මකව හෝටල් පාසල් විෂය නිර්දේශය අධ්‍යයනය කිරීම
- ඒකාබද්ධ හෝටල් පාඨමාලා පැවැත්වීම සඳහා ජාත්‍යන්තර හෝටල් පාසල් සමඟ හවුල්කාරිත්වය සහ අපගේ සිසුන්ට විදේශයන්හි පුහුණු අවස්ථා ලබා ගැනීම.

# 02

## දෙවැනි කුළුණ:
## කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් සහ සංචාරක කර්මාන්තයේ ප්‍රමිති ඉහළ නැංවීම






## සංචාරක සේවා සපයන්නන් ලියාපදිංචිය වැඩි කිරීම

- සංචාරක නවාතැන් සපයන්නන්ගේ ලියාපදිංචිය 39%කින් වැඩි කිරීම
- 100% මාර්ගගත ලියාපදිංචිය
- කර්මාන්තයට සහාය වීම සඳහා නිකුත් කරන ලද තාවකාලික ලියාපදිංචිය
- ඕස්ට්‍රේලියානු රජයේ සහයෙන් MDF ආයතනයේ ආධාර ඇතිව ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ වීඩියෝ සහ ඩිජිටල් ක්‍රමවේදයක් සැකසීම

## අවශ්‍ය ලියකියවිළි අඩුකොට විධිමත් කරන ලද කාර්යාවලිය

- USAID SAIL ව්‍යාපෘතියේ සහ සංචාරක ව්‍යාපෘති අනුමත කිරීමට අදාල සියලුම රාජ්‍ය ආයතනවල සහයෝගයෙන් නව සංචාරක ආයෝජන සඳහා අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම
- ප්‍රලේඛන අඩු කරමින් පොදු අයදුම්පතක් සකස් කරන ලදී
- ඕස්ට්‍රේලියානු රජයේ සහයෙන් MDF ආයතනයේ ආධාර ඇතිව BOI, UDAA, CC සහ CRMD වැනි ප්‍රධාන රාජ්‍ය ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමෙන් අන්තර් නියෝජිත ආයතන සහයෝගීතාව ශක්තිමත් කිරීම

## පොදු වියදුම් අවම කිරීම

- ඵලදායී ලෙස වියදම් අඩු කිරීම සංචාරක සංවර්ධන අධිකාරියේ පොදු වියදම් 23%න් පමණ අඩු කරන ලදී.
- සංචාරක සංවර්ධන අධිකාරි සතු නිඩාඩු නිකේතනයන්හි අලාභ අඩු කිරීම සහ ඒවා ලාභ ලබන ආයතන බවට පත් කිරීම.

## සංචාරක ආයෝජන සඳහා ඉඩම් බැංකුවක් සැකසීම

- 40%ක් පමණ වැඩ අවසන් කොට ඇත

## ආයතනයීය ධාරිතාව වැඩිදියුණු කිරීම

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ඕස්ට්‍රේලියානු රජයේ ආධාර යටතේ MDF ආයතනය හරහා ප්‍රවර්ධන කටයුතු, ප්‍රසම්පාදන කටයුතු සහ මහජන සම්බන්ධතා අංශ වලින් සංචාරක ආයතනයන්හි හැකියාවන් හා ධාරිතාව වැඩි කරන ලදී.

# 03

## තුන් වැනි කුළුණ:
## තාක්ෂණය පදනම් කරගත් සංචාරක කර්මාන්තයක්



## සංචාරක ජංගම යෙදවුම

## දැනට අවසන්ව ඇති කටයුතු

- කෝවිඩ් 19 සෞඛ්‍යාරක්ෂණ ක්‍රමවේද හා ප්‍රොටෝකෝලයන්ට අනුකූලව සංචාරකයන් මෙරටට ගෙන්වා ගැනීම පහසු කරනු ලැබීමට, ආගමන විගමන දෙපාර්තමේන්තුවේ විද්‍යුත් වීසා කවුළුව හරහා සම්බන්ධ කිරීමට හැකි සංචාරක යෙදවුමෙහි මූලික පියවර සකස් කොට ඇත. මෙය සකස් කරන ලද්දේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ (ICTA) සහාය ඇතිවය.

## සිදු කරගෙන යනු ලබන කටයුතු

- සංචාරක යෙදවුමෙහි පළමු පියවර හරහා ලංකාවේ ඇති ආකර්ෂණීය ස්ථාන 5,000කට ආසන්න ප්‍රමාණයක් පිළිබඳ තොරතුරු, ගූගල් සිතියම්, සංචාරක ස්ථාන සඳහා ටිකට්පත් මිළදී ගැනීම, ප්‍රතිචාර දැක්වීම, හදිසියකදී තමා සිටිනා ස්ථානයද ඇතුළුව ලඟම ඇති සංචාරක පොලීසිය දැනුවත් කිරීමේ හැකියාව වැනි සේවා රැසක් සපයනු ඇත. මෙම කටයුත්ත සඳහා තොරතුරු තාක්ෂණ ආයතනය, ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව යන ආයතන වල සහයෝගයෙන් සිදු කරනු ලබයි.

## ඩිජිටල් මාර්ගගත පුහුණුව

## සිදු කරගෙන යනු ලබන කටයුතු

- කෝවිඩ් 19 වසංගත කාලය තුළ හෝටල් පාසලෙහි අධ්‍යයන කටයුතු මාර්ගගත ක්‍රමයට සිදු කිරීම ආරම්භ කරන ලදී.

## පරිපූර්ණ සංචාරක තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම

## සිදු කරගෙන යනු ලබන කටයුතු

- කඳු නැගීම, කඳවුරු බැඳීම, බයිසිකල් පැදීම, බෞද්ධ චාරිකා මාවත්, රාමායන චාරිකා මාවත්, සංචාරක ආකර්ෂණ ස්ථාන 4950 කට වැඩිසංඛ්‍යාවක් හා වනජීවී ස්ථාන වැනි තොරතුරු රැසක් දැනටමත් එක් රැස් කර ඇත.
- මේ සඳහා ප්‍රසම්පාදනයට අවශ්‍ය කොන්දේසි සකස් කර ඇති අතර ප්‍රසම්පාදන කටයුතු අරඹා ඇත.
- මෙලෙස සකස් කරනු ලබන තොරතුරු වෙබ් අඩවිය හා ජංගම යොදවුම සඳහා භාවිත කරනු ඇත.

## තාක්ෂණය හරහා සංචාරක පොලීසිය සම්බන්ධ කර ගැනීම

- සංචාරක කොට්ඨාශයේ නව නියෝජ්‍ය පොලිස්පතිවරහා හා මේ සම්බන්ධයෙන් සමීප සාකච්ඡාවක් පවත්වාගනිමින් සිටී
- සංචාරක ජංගම යෙදුම හරහා හදිසියකදී පොලීසිය සම්බන්ධ කර ගැනීමට මූලික එකඟතාව ලැබී ඇත.

## වෙබ් අඩවි නැවත සකස් කිරීම

- සංචාරක සංවර්ධන අධිකාරියේ සහ සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ වෙබ් අඩවි දෙකම නැවත සකස් කිරීමට බලාපොරොත්තු වේ.
- මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු අවසන් කොට, ආයතනය තෝරාගෙන ඇත.

## සංචාරක ව්‍යාපාරය සඳහා පරිපූර්ණ දත්ත රැස් කිරීම

## දැනට අවසන්ව ඇති කටයුතු

- මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංචාරක සංවිධානයේ සහයෝගය ලැබී ඇත.
- තාක්ෂණික සහාය සඳහා එක්සත් ජාතීන්ගේ සංචාරක සංවිධානය, ශ්‍රී ලංකා මහ බැංකුව හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව සමග ගිවිසුම් අත්සන් කිරීම හරහා, සැළසුම්කරණය සඳහා අවශ්‍ය දත්ත ලබාගැනීමටත්, එම දත්ත විශ්ලේශනය කොට ප්‍රකාශයට පත් කිරීමටත් සැළසුමකොට ඇත.

## මාර්ගගතව අප හා එක්වන ප්‍රේක්ෂකයන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීමටත් නරඹන්නන් වැඩිකර ගැනීමටත් පෙරහැර කිහිපයක් සජීවීව විකාශනය කිරීමට කටයුතු කිරීම

ඉතිහාසයේ පළමු වතාවට මහනුවර ඇසළ පෙරහැර තායි භාශාවෙන් සිදු කරන විස්තර ප්‍රකාශය සමග තායිලන්තයේ සජීවීව විකාශනය සිදු කරන ලදී. මේ සඳහා ලංකාවේ තායිලන්ත තානාපති කාර්යාලය හා තායිලන්තයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහයෝගය ලබා දෙන ලදී.

ලොව වටා සිටින වන ජීවී ලෝලීන් ඉලක්ක කරගනිමින් “Couch Safari” නම් සන්නාමය යටතේ ශ්‍රී ලංකාවේ වනජීවීන් පිළිබඳ සජීවී විකාශන සිදු කරන ලදී.

වනජීවී සජීව විකාශනය යාල, මින්නේරිය, කවුඩුල්ල සහ උඩවලව වනෝද්‍යානයෙහි සිට සිදු කරන ලද අතර, මේ සඳහා නරඹන්නන් 350,000ක් පමණ සහභාගි විය. ඉන් 40% පමණ විදේශිකයන් විය.

සම්පූර්ණ ප්‍රචාරණ වැඩසටහන සමග නරඹන්නන් මිලියන 22ක් පමණ එක් වූ අතර, වීඩියෝ හරහා තවත් ලක්ෂ 17ක් නරඹා තිබිණි. මෙම කාලය තුළ ශ්‍රී ලංකා සංචරණ ෆෙස්බුක් පිටුව හා ප්‍රේක්ෂකයින් ලක්ෂ 70ක් පමණ එක් වූ අතර, මේ හරහා වීඩියෝ නැරඹුම් ලක්ෂ 14කට වඩා තිබූ අතර, බෙදා හැරීම් 5,500 කට වඩාත් අදහස් දැක්වීම් 3,500 කට වඩාත් ලැබ තිබිණි. සම්පූර්ණ වැඩසටහන් කාලසීමාව තුළ ෆෙස්බක් ජාලය හරහා මිලියන 11 වැඩි පිරිසක් වෙත ලඟා වී තිබූ අතර, සබැඳිය වෙත පිවිසීම් (Link Clicks) 16,000 කට වැඩි විය.

මෙම “Couch Safari” ප්‍රවර්ධන සම්පූර්ණයෙන් ගත කල, ඒ හරහා ශ්‍රී ලංකා සංචරණයේ ෆෙස්බුක් පිටුවේ වීඩියෝ නැරඹීම 4000% න් පමණද, ජනතාවගේ සම්පවීම් 3000% පමණද, නරඹන්නගේ සම්බන්ධතාවන් 400%න් පමණද වැඩිවී ඇත. සෘජු සජීවී විකාශය හරහා පමණක් උනන්දු වීම් 350,000 ක් පමණ, වීඩියෝ නැරඹීම් 100,000 කට වඩා, නරඹන්නගේ සම්බන්ධතාවන් 35,000ක් පමණ, අදහස් දැක්වීම 2,400ක් හා බෙදාහැරීම් 2,700ක් ලැබී තිබිණි.

# 04

## හතර වන කුළුණ:
## සංචාරකයන් සඳහා ආරක්ෂා සහිත සහ සුරක්ෂිත රටක්





- රටපුරා සංචාරක ආකර්ෂණ ස්ථානයන්හි ඇති ආරක්ෂාව සම්බන්ධ ගැටළු හඳුනා ගැනීම සඳහා කර්මාන්තය පුරා සමීක්ෂණයක් පවත්වා ඒ අනුව සංචාරක පොලීසි පිහිටුවීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත
- පළමු වතාවට සංචාරක පොලීසිය සඳහා නියෝජ්‍ය පොලිස්පතිවරයකු පත් කරන ලදී
- කෝවිඩ් -19 සෞඛ්‍යාරක්ෂක ක්‍රමවේදය සහතික කිරීම හරහා සංචාරකයන්ගේ මෙන්ම දේශීය ප්‍රජාවගේද ආරක්ෂාව තහවුරු කිරීම
- KPMG ස්වාධීන විගණන සමාගම හරහා සෞඛ්‍යාරක්ෂිත බව සහ සුරක්ෂිත භාවය සහතික කිරීම සිදු කෙරෙමින් පවතින අතර, මේ වන විට සංචාරක හෝටල් 131ක් ද සංචාර සංවිධානය කරන ආයතන 42ක්ද සෞඛ්‍යාරක්ෂිත බව සහ සුරක්ෂිත භාවය පිළිබඳ සහතිකය ලබා ඇත
- සහතිකයෙහි QR කේතයක් හරහා අමුත්තන්ට ඔවුන්ගේ හෝටලය විසින් ඉහත සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් අනුගමනය කරනු ලබන්නේද යන්න  සහ ඒ පිළිබඳ ගැටළුවක් ඇතිනම් නියාමන අධිකාරිය දැනුවත් කිරීමේ හැකියාව
- සංචාරක ජංගම යෙදවුමෙහි පළමු පියවර හරහා හදිසියකදී තමා සිටිනා ස්ථානයද ඇතුළුව ලඟම ඇති සංචාරක පොලීසිය දැනුවත් කිරීමේ හැකියාව
- දිවයින පුරා සංචාරක පොලිස් ඒකක ස්ථානගත කිරීම. මේ වන විට අවශ්‍ය ස්ථාන හඳුනාගනු ලැබ ඇති අතර මූලික වැඩ කටයුතු ආරම්භ කර ඇත.

# 05

## පස් වන කුළුණ:
## නෛතික හා නියාමන රාමුව





## සිදු කරගෙන යනු ලබන කටයුතු

- ජාත්‍යන්තර වශයෙන් උසස්ම භාවිතයන් ඇති රටවල් ආදර්ශයට ගනිමින් ආයතනික ව්‍යුහය නැවත සළකා බැලීම
- නවාතැන් වර්ගීකරණය පිළිබඳ මාර්ගෝපදේශ හා සම්පත් වැඩි දියුණු කිරීම
- නව සංචාරක ව්‍යාපෘති අනුමත කිරීමේදී ජාත්‍යන්තරව පිළිගැනීමට හා ඇගයීමට ලක්වන වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් තහනම් කිරීම සහ වෙනත් තිරසාර මූලධර්ම හරහා තිරසාර සංචාරක කර්මාන්තයක් සහතික කිරීම
- සංචාරක කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලන පරිදි සංචාරක සේවා සපයන ස්ථාන සඳහා මත්පැන් බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය විධිමත් හා ඵලදායී කිරීමට රෙගුලාසි සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම
- විවිධ රාජ්‍ය, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල අධිකාරී බලයන් එකිනෙක හා නොගැටෙන පරිදි සමාලෝචනය කිරීම සහ රෙගුලාසි යතාවත් කිරීමට සහාය වීම
- දැනට සංචාරක හෝටල් වලින් අය කරනු ලබන මුළු පිරිවැටුමෙන් 1% වන පළාත් පාලන බද්ද අනෙකුත් කර්මාන්ත හා සමාන වන පරිදි සංශෝධනය කිරීම
- නව සංචාරක පනත හරහා ශ්‍රී ලංකා සංචරණයේ පවත්නා ආයතන හතරම හෝ තුනක් ඒකාබද්ධ කිරීම.
- ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය උපාධි ප්‍රදානය කරන ආයතනයක් බවට පත් කිරීම.

# 06

## සය වන කුළුණ:
## තිරසර හා පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය





## දැනට අවසන්ව ඇති කටයුතු

- ජාතික තිරසර සංචාරක සහතිකකරණය (NSTC) ආරම්භකර ඇත.

## සිදු කරගෙන යනු ලබන කටයුතු

- සීගිරිය හා අවට ප්‍රදේශය පළමු තිරසර සංචාරක කලාපය ලෙස සංවර්ධනය කිරීම. මේ සම්බන්ධයෙන් කෙටුම්පත මධ්‍යම සංස්කෘතික අරමුදල හා අනෙකුත් පාර්ශවකරුවන් සමග බෙදාගනු ඇත.
- යාල පලටුපාන කලාපය සංරක්ෂිත සංචාරක ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන අතර, ඒ සඳහා මාර්ගෝපදේශ සකස් කරමින් පවතී.
- අලුතින් අනුමත කරනු ලබන සියළුම සංචාරක ව්‍යාපෘති සඳහා පුනර්ජනනීය බලශක්තිය, ප්‍රතිචක්‍රීකරණය, වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් වලින් තොරවීම වැනි තිරසර අවශ්‍යතා සළකා බලනු ලබයි.
- වෙන් වෙන්ව පිහිටි බුටික් හෝටල් සඳහා මෙම තිරසර අවශ්‍යතා සපුරා ගැනීමට යම් කාලසීමාවක් දෙනු ලැබේ.
- 2030 වනවිට එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම.
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරීය හා පරිසර අමාත්‍යාංශය සමග එක්ව වෙරළ තීරයේ සහ සාගරයේ පවිත්‍රතාව සහ සුවතාව සහතික කිරීමට ඒකාබද්ධව කටයුතු කරයි.

# 07

## සත්වන කුළුණ:
## නව සංචාරක නිපැයුම් සකස් කිරීම සහ ප්‍රවර්ධනය





## නව සංචාරක කණ්ඩායම් ආකර්ෂණය කර ගැනීම සඳහා නව සංචාරක නිපැයුම් සංවර්ධනය

- මහජන සම්බන්ධතා නියෝජිතයා ලෙස JWT සහ ඩිජිටල් අලෙවිකරණ නියෝජිතයා ලෙස E Marketing Eye සමාගමත් පත්කර ඇත.
- නව නිෂ්පාදන සංවර්ධනයේ අංශ හඳුනා ගැනීම සඳහා කර්මාන්ත පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගනිමින් පවතී.
- කෝවිඩ් -19 වසංගතය හේතුවෙන් ඩිජිටල් මාධ්‍ය හරහා ශ්‍රී ලංකා සංස්කෘතිය ලොවට ප්‍රදර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් දුරුතු පෙරහැර , නවම් පෙරහැර, මහනුවර ඇසළ පෙරහැර සහ රුහුනු කතරගම පෙරහැර යන උත්සවාදීන්ට අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී.

## බෞද්ධ මංපෙත් ප්‍රවර්ධනය

අපගේ බෞද්ධ උරුමය හා බැඳුනු බෞද්ධ මංපෙත් ආශ්‍රිත සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට සංචාරක කර්මාන්තයේ නියැලුනු නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලද අතර, වෙබ් අඩවි සංවර්ධනය, මාස්ටර් කාඩ් හරහා පැකේජ ප්‍රවර්ධනය කිරීම සහ වසංගතය හේතුවෙන් කල් දැමූ වෙසක් උත්සවය පැවැත්වීම ඇතුළු විවිධ ක්‍රියාකාරකම් මෙහිදී සලකා බැලේ. තායිලන්තයේ දූත මණ්ඩලවල සහාය ඇතිව මේ සඳහා සකස් කරන ලද වෙබ් පිටුව තායි භාෂාවට පරිවර්තනය කරන ලදී.

## රාමායණ ප්‍රවර්ධන වැඩසටහන

රාමායණය හා බැඳුනු ස්ථාන වෙත සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ලාභදායී වෙළඳපොලක් ඉන්දියාවෙන් අපට සකස් කර ගැනීමට අවස්ථාව ඇත. කර්මාන්තයේ සංචාරක නියෝජිතයින් 94 දෙනෙකු සඳහා පෙබරවාරි මාසයේ දිනක පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලද අතර කෝවිඩ් -19 හේතුවෙන් මෙම සැසිය කල් තබන ලදී.

## අන්තර්ගත සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධන මෙවලමක් ලෙස රූප හා වීඩියෝ ගැලරිය නිර්මාණය කිරීම සඳහා සංචාරකයින් ආකර්ෂණය කර ගත හැකි ස්ථාන පන්දහසක් පමණ එකතු කර ඇත්තෙමු. ආරම්භක අදියරක් ලෙස, ශ්‍රී ලංකාවේ අන්තර්ගතය ක්ෂුද්‍ර වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආකර්ශනීය ස්ථානවලට ප්‍රමුඛත්වය දුන් ජාතික සංචාරක මාර්ගෝපදේශ සංගමයේ පළපුරුදු සංචාරක මාර්ගෝපදේශකයින් හය දෙනෙකු සමඟ පළමු ඇගයීම් SLTPB විසින් පවත්වන ලදී.

## eXPLOREpLACES සංචාරක ප්‍රවර්ධන මාධ්‍යයේ නොමිළේ ප්‍රචාරණ අවස්ථා

**eXPLOREpLACES** යනු ලොව පුරා ප්‍රේක්ෂකයන් මිලියන 39 ක් පමණ සිටින ඕස්ට්‍රේලියානු වෙබ් අඩවියකි. ගමනාන්ත සංචාරක නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා එය වීඩියෝ ආකෘතියෙන් සංචාරක තොරතුරු සපයයි. මෙම ආයතනය ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ වෙළඳ ප්‍රචාරණ කටයුතු සඳහා ඕස්ට්‍රේලියානු ඩොලර් 21,000 ක් වටිනා වෙළඳ ප්‍රචාරණ අවස්ථාවක් නොමිලයේ මාස 6ක කාල සීමාවක් ලබා දුන්නේය.

## නැව් යාත්‍රා සංචරණය සංවර්ධනය

නැව් යාත්‍රා සංචාරය ප්‍රවර්ධනය කිරීම සඳහා නැව් යාත්‍රා ක්‍රියාකරුවන් සමඟ රැස්වීමක් පවත්වන ලදී. සංචාර සඳහා කොළඹින් ගොඩබසින මගීන්ගේ ප්‍රයෝජනය සඳහා කොළඹ නගර සිතියමක් නිර්මාණය කිරීම ආරම්භ කරන ලදී. එසේම, මේ සඳහා වෙනම වෙබ් පිටුවක් නිර්මාණය කිරීම ආරම්භ විය.

## ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත ප්‍රවර්ධනයට සහාය වීම

ආරම්භක පියවරක් ලෙස, මහනුවර නත්තරන්පොත ගම්මානය (කලාපුරය) ප්‍රවර්ධන කටයුතු සඳහා තෝරාගෙන ඇත්තේ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ඡායාරූප සහ වීඩියෝ ඇතුලත් විශේෂිත වෙබ් අඩවියක් සංවර්ධනය කිරීමෙනි.

## සුවතාවය සහ ආයුර්වේදය

- ආයුර්වේදය සහ හෙළ වෙදකමෙහි උරුමය සමඟ ශ්‍රී ලංකාවේ ලෝකයේ වර්ධනය වන සුවතා සංචාරක ව්‍යාපාරය සඳහා ශ්‍රී ලංකාවට විශේෂ ස්ථානයක් ලැබී ඇත.
- ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට යුරෝපා සංගමය විසින් ආයුර්වේදය සහ හෙළ වෙදකම ඉලක්ක කර ගනිමින් සුවතා සංචාරක ව්‍යාපාරය දියත් කිරීම සඳහා සහාය දීමට එකඟ වී තිබේ. දැනට අවශ්‍ය කොන්දේසි සකස් කරමින් පවතී.

## චිත්‍රපට සංචාරක ව්‍යාපාරය

## චිත්‍රපට සංචාරක ව්‍යාපාරය යනු ගමනාන්ත අලෙවිකරණය සඳහා යොදාගත හැකි විශිෂ්ට ක්‍රමයකි.

ජාතික චිත්‍රපට සංස්ථාව සමග ජාත්‍යන්තර චිත්‍රපට, වාර්තා චිත්‍රපට, රූපවාහිනී නිෂ්පාදන සිදුකිරීම සඳහා සහයෝගීතාව සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය පහසු කිරීම සඳහා වර්තමාන ක්‍රියාවලිය විධිමත් කිරීමට තනි කවුළු අනුමත කිරීමේ ක්‍රමයක් (SWA) හඳුන්වා දීම. මෙම ක්‍රියාවලිය අන්තර්ජාතික චිත්‍රපට සඳහා සහය දැක්වීමට සුදුසුම ක්‍රියාමාර්ගය වේ. ගමනාන්ත ප්‍රතිරූපය ගොඩනැගීම සහ ශ්‍රී ලංකාව ජයග්‍රහණය කරා ගෙනයෑම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර චිත්‍රපට නිෂ්පාදකයින්ගේ සංගමය (IFPA) සමඟ එක්ව ප්‍රවර්ධන වීඩියෝවක් නිර්මාණය කිරීමට නියමිතය. ඒ අතරම, ඉන්දියාවේ චිත්‍රපට සම්මේලනය සමග එක්ව චිත්‍රපට නිෂ්පාදකයන් හා ස්ථාන කළමනාකරුවන් සඳහා ස්ථාන පිළිබඳ හඳුන්වාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරමින් පවතී.

## ත්‍රාසජනක හා ක්‍රීඩා සංචාරක ව්‍යාපාරය

ශ්‍රී ලංකාවේ පුළුල් පරාසයක ක්‍රීඩා ඉසව් ඉතා සිත්ගන්නාසුලු ස්ථානයන්හි ආරම්භ කිරීමේ හැකියාව ඇත.

දේශීය ප්‍රජාව අතර සර්ෆ් ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සර්ෆින් සම්මේලනය සමඟ එක්ව 2020 මාර්තු මාසයේදී හික්කඩුවෙහි සර්ෆින් ජාතික ශුරතා තරඟ පැවැත්විණි. මෙම අවස්ථාවට විදේශීය සංචාරකයින් ද ආකර්ෂණය නොමදව ලැබුණි.

සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් දිලන්ත මාලගමුවගේ ජාත්‍යන්තර ධාවන තරඟ සඳහා අනුග්‍රහය දැක්වීය. 2020 ඔක්තෝබර් / නොවැම්බරයේ ස්පාඤ්ඤයේ, බෙල්ජියමේ සහ ප්‍රංශයේ ලැම්බෝගිනි සුපර් ට්‍රොෆියෝ යුරෝපා ධාවන තරඟය නිසා ශ්‍රී ලංකා නාමය මෙවැනි අවස්ථාවන් නරඹන ඉහළ පෙළේ අමුත්තන්ගේ මනසෙහි රැඳවීමට හැකියාව ලැබිණි.

## සංස්කෘතික සංචාරක ව්‍යාපාරය

ශ්‍රී ලංකාවේ වටිනා සංස්කෘතික උරුමයක් වන පෙරහැර කර්මාන්තය හරහා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා සංස්කෘතිය ලොවට ප්‍රදර්ශනය කිරීම සඳහා දුරුතු පෙරහැර, නවම් පෙරහැර, මහනුවර ඇසළ පෙරහැර සහ රුහුනු කතරගම පෙරහැර යන පෙරහැර උත්සව සඳහා දායකත්ව අනුග්‍රහය සපයන ලදී.

## ජාත්‍යන්තර හා දේශීය ගුවන් තොටුපලවල්

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන්තොටුපළ පහක් සහ දේශීය ගුවන් තොටුපළ නවයක් ඇත. කෝවිඩ්- 19 වසංගතය අතරතුර රත්මලානෙහි පිහිටි කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපල විවෘත කරන ලදී. ඊට අමතරව ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය මගින් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට ළඟා විය හැකි මුහුදු ගුවන් යානා සහ හෙලිකොප්ටර් යානා මගින් ඉහල අදායමක් ලබා ගැනීම සඳහා සංචාරක අංශයට සහාය විය හැක.

- රත්මලාන ගුවන්තොටුපලෙහි කුඩා ජෙට් යානා සහ මගීන් 200ක් දක්වා වූ ජාත්‍යන්තර කුඩා මගී ගුවන්යානා වල ගුවන් ගමන් මෙම වසර තුළ ආරම්භ කරන ලදී.
- පුද්ගලික ජෙට් සඳහා අනුමැතිය දීමේ කාලය කිරීම් පැය 72 සිට පැය 24 දක්වා අඩු කර ඇත
- කටුනායක ගුවන් තොටුපල පුළුල් කරමින් දෙවන මගී පර්යන්තයේ ඉදිකිරීම් ආරම්භ වූ අතර එමගින් අද්විතීය සැලසුමක් සහිතව වසරකට මගීන් මිලියන 6 සිට මිලියන 15 දක්වා ධාරිතාව ඉහළ නංවනු ඇත.




### Five International Airports and Nine Domestic Airports in Sri Lanka

- International Airports
1. Katukurunda Airport
2. Koggala Airport
3. Weerawila Airport
4. Ampara Airport (Gal Oya)
5. China Bay Airport
6. Hingurakgoda Airport
7. Sigiriya Airport
8. Anuradhapura Airport
9. Vavuniya Airport

## පර්යේෂණයන්හි ඉදිරි ගමන

ඕස්ට්‍රේලියානු රජයේ සහයෝගයෙන් MDF ආයතනයේ සහාය ඇතිව මෙම සැළසුම සකස් කරමින් පවතී. මූලික කෙටුම්පත් මාර්ග සැළසුම සකස් කිරීම හා සහ ධාරිතා වර්ධන වැඩමුළු 3 ක් 2020 දෙසැම්බර් 7 සිට ආරම්භ කිරීමට සැලසුම් කර ඇත

## නව සංචාරක අත්දැකීම් අංශය

අතීතයේ දී අවධානය යොමුව තිබුනේ තෝරාගත් රට අනුව ප්‍රවර්ධන කටයුතු කිරීමය. කෙසේ වෙතත්, වසර ගණනාවක් තිස්සේ පැවතගෙන එන ගෝලීය ප්‍රවණතාවය අනුව ලබන අත්දැකීම් අනුසාරයෙන් ප්‍රවර්ධන අවශ්‍යතා සැළසුම් කළ යුතුය; එහිදී ත්‍රාසජනක අත්දැකීම් හා ක්‍රීඩා, වනජීවී, සුවතාව, සංස්කෘතිය, දේශීය ආහාර යනාදිය සැළකිය හැක හැක.

MDF- ඕස්ට්‍රේලියා හවුල්කාරිත්වය සහ සහාය ඇතිව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය අත්දැකීම් සඳහා ආයතනික ඒකකයක් පිහිටුවීම දැනටමත් ආරම්භ කර ඇත.

## ජාත්‍යයන්තර සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් වලට සහභාගී වීම

සංචාරක ප්‍රවර්ධන කාර්යංශය විසින් වසරේ පළමු කාර්තුවේදී සංචරණ හා සංචාරක ප්‍රදර්ශන 24 කට සහභාගී වී තිබේ. නෝර්වේ, නෙදර්ලන්තය, ජර්මනිය, ඔස්ට්‍රියාව, ෆින්ලන්තය, ලක්සම්බර්ග්, ස්පාඤ්ඤය, ස්විට්සර්ලන්තය, එක්සත් රාජධානිය, බෙල්ජියම, ඉතියෝපියාව, ඉතාලිය, ඊශ්‍රායලය, චෙක් ජනරජය, ඉන්දියාව, තායිලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දුනීසියාව, ඩෙන්මාර්කය සහ ලිතුවේනියාව යන රටවල වෙළඳ ප්‍රදර්ශන පැවැත්විණි. මීට අමතරව ATM (ඩුබායි) සහ WTM (එක්සත් රාජධානිය) මාර්ගගත ක්‍රමයට පැවැත්විණි.

## වෙළඳපොල හුරුපුරුදු කරවීමේ චාරිකා

වෙළඳපොල හුරුපුරුදු කරවීම සඳහා මෙම වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවලදී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සහ ස්වීඩනයේ  චාරිකාවන්ට සහභාගි විය.

## උමං මාර්ගයන්හි වෙළඳ ප්‍රචාරණ ව්‍යාපාරය - එක්සත් රාජධානිය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2020 ජනවාරි සිට මාර්තු දක්වා එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර උමං මාර්ගවල වෙළඳ ප්‍රචාරණ ව්‍යාපාරයක් පවත්වන ලදී. 2020 දී දුම්රිය ස්ථාන 10 ක මෙම ප්‍රචාරණ ක්‍රියාවලිය සිදු කරන ලදී.






## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහයෝගයෙන් විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් සංවිධානය කරන ලද ක්‍රියාකාරකම්

- එක්සත් රාජධානිය - ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ 72 වන නිදහස් දින සැමරුමට සමගාමීව 220 ක සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා ආහාර උළෙලක් සහ සංගීත ප්‍රසංගයක් සංවිධානය කිරීම.
- පිලිපීනය - ජාල සැසිය සමඟ සංස්කෘතික සන්ධ්‍යාවක් සහ පිලිපීනයේ සංචාරක ක්‍රියාකරුවන් සමඟ ව්‍යාපාර සාකච්ඡාවක් පැවැත්විණි . ශ්‍රී ලංකා කර්මාන්ත සාමාජිකයින් සමඟ ජාලගත සැසිවාරයට ඉහළ මට්ටමේ තීරණ ගන්නන් 110 ක් සහභාගී වූහ.
- එක්සත් අරාබි එමීර් රාජ්‍යය - අබුඩාබියේ ප්‍රධාන සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන් සමඟ ජාල සැසිය.
- ජපානය - ශ්‍රී ලංකා දූත මෙහෙවර 2020 පෙබරවාරි 08 සිට 09 දක්වා ෆුකෝකා සංචාරක සම්මන්ත්‍රණය සහ 2020 පෙබරවාරි 12 වන දින ටෝකියෝ නුවර 80කට අධික මාධ්‍යවේදීන් රැසකගේ සහභාගිත්වයෙන් මාධ්‍ය හමුවක් සංවිධානය කරන ලදී.
- ඔස්ට්‍රියාව - ලෝක ළමා දින සැමරීම සඳහා ඔස්ට්‍රියාවේ ශ්‍රී ලංකා මෙහෙයුම විසින් සූපශාස්ත්‍ර උත්සවයක් සහ සරුංගල් උත්සවයක් සංවිධානය කරන ලදී.
- රුසියාව - රුසියානු සංචාරක ක්‍රියාකරුවන්ගේ සංගමය විසින් මාර්ගගත වට මේස සාකච්ඡාවක් පැවැත්විණි. මාධ්‍යවේදීන් සමඟ රුසියානු සංචාරක ක්‍රියාකරුවන් සහ සංචාරක කර්මාන්තයේ අනෙකුත් නියෝජිතයින් 260 කට වැඩි පිරිසක් එක්රැස් වූහ.
- ජර්මනිය - ජර්මනියේ “we love travel” පෝටලය හරහා ශ්‍රී ලංකාව පිළිබඳ මාර්ගගත ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී.

## BIMSTEC සංචාරක ක්‍රියාකරුවන්ගේ රැස්වීම

ශ්‍රී ලංකාව 2020 දෙසැම්බර් 8 සහ 9 දිනවල දී මාර්ගගතව පවත්වන ලද දෙවන BIMSTEC සංචාරක ක්‍රියාකරුවන්ගේ රැස්වීමේ සත්කාරකත්වය හොබවන ලදී. එයට බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය, තායිලන්තය යන රටවල් සහභාගී වූ අතර එහිදී BIMSTEC ප්‍රවර්ධනය, තොරතුරු මධ්‍යස්ථානය, මූල්‍ය ප්‍රතිපාදන, බෞද්ධ සහ සිද්ධස්ථාන මංපෙත් සඳහා කලාපීය සහයෝගිතාවය, පාරිසරික සහ ත්‍රාසජනක සංචාරක ව්‍යාපාරය සහ නැව් යාත්‍රා සංචරණය යනාදිය පිළිබඳව කතිකා කරන ලදී.

## මාර්ගගත රැස්වීම් (Webinar)

- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය විසින් රුසියාව, එක්සත් රාජධානිය, පාකිස්තානය, නෝර්වේ, ස්වීඩනය සහ බෝල්ටික් කලාපවල වෙබ් සාකච්ඡා සංවිධානය කරන ලදී.
- රුසියාව විසින් සංවිධානය කළ මාර්ගගත රැස්වීමට රුසියාව, යුක්රේනය, බෙලාරුස්, ජෝර්ජියාව, උස්බෙකිස්තානය සහ ඉරානය ඇතුළු රටවල් හයකින් සංචාරක ක්‍රියාකරුවන් / සංචාරක නියෝජිතයින් 126 දෙනෙකු සහභාගි විය.
- ස්කැන්ඩිනේවියානු කලාපය - PATA විසින් එහි ප්‍රධාන විධායක නිලධාරියාගේ සහභාගීත්වයෙන් පවත්වන ලද වෙබ් සාකච්ඡා වෙත කලාපයේ සංචාරක ක්‍රියාකරුවන් 60 කට අධික පිරිසක් සහභාගී වූහ.
- එක්සත් රාජධානිය - එක්සත් රාජධානියේ පිළිගත් මාධ්‍ය සහභාගී වූ අතර එහි සත්කාරකත්වය දරනු ලැබුවේ ANTOR (ජාතික සංචාරක කාර්යාල සහ නියෝජිතයින්ගේ සංගමය) ය.
- පකිස්ථානය - පාකිස්තානයේ සංචාරක ක්‍රියාකරුවන් / සංචාරක නියෝජිතයින් 16 දෙනෙක් සහභාගී වූහ.
- ඕස්ට්‍රේලියාව - බොනෙයිලි වර්ල්ඩ් ආයතනය ශ්‍රී ලංකා සංචරණ සභාපතිනිය සමඟ සම්මුඛ මාර්ගගත සාකච්ඡාවක් පවත්වන ලදී. නව යුගයක ගමනාන්ත සූදානම සහ නව්‍යකරණය පිළිබඳ නව ගෝලීය වේදිකාවක් වන Bonailie.world/webinar මගින් ලොව පුරා සංවිධානය කරන ලද වෙබ් සාකච්ඡා මාලාවක් සඳහා සභාපතිනිය ආරාධිත කථිකයෙකු වශයෙන් සහභාගි විය.
- චීනය (ෂැංහයි) - චීනයේ විශාලතම ඩිජිටල් ට්‍රැවල් සහ ලෙෂර් ආයතනය වන ට්‍රිප්.කොම් හි සභාපතිනිය විසින් කලින් වාර්තා කරන ලද සම්මුඛ සාකච්ඡා පැවැත්වීම.
- ඊජිප්තුව - නයිල් ටීවී සමඟ සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වුනි. ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය 2020 නොවැම්බරයේදී මධ්‍යධරණී සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමට ගෝලීය වශයෙන් කටයුතු කරමින් සිටියි.

## බ්ලොගර්වරුන් හරහා ප්‍රවර්ධන කටයුතු (VBP)

VBP යනු තෝරාගත් ජාත්‍යන්තර සංචාර බලපෑම් කරන්නන් සහ ඩිජිටල් කතන්දරකරුවන් සඳහාවන වාර්ෂික වැඩසටහනකි. ශ්‍රී ලංකාව ඒ සඳහා සත්කාරකත්වය සපයනු ලබන්නේ ඔවුන් සඳහා ගැලපෙන සංචාරක අත්දැකීම් ලබා දීමෙනි.ඒ අනුව, අනුගමනය කරන්නන් මිලියන 6 කට වඩා වැඩි සංඛ්‍යාවක් සහිත සංචාරක බලපෑම් කරන්නන්ට (එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, ජර්මනිය, ඉන්දියාව, ස්විට්සර්ලන්තය, නෝර්වේ, ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව වැනි රටවල) මේ සඳහා ආරාධනා කරන ලද අතර ඔවුන් COVID-19 වසංගත අගුලු දැමීමේ කාලය තුළ විවිධ සංචාර බ්ලොග් සහ ජනප්‍රිය සමාජ මාධ්‍ය සඳහා අන්තර්ගතයන් 540 කට අධික ප්‍රමා-ණයක් නිර්මාණය කර ඇත.

- 2020 දී එක්සත් රාජධානිය, ජර්මනිය, නෝර්වේ, ස්විට්සර්ලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව යන රටවලින් ප්‍රධාන ධාරාවේ සංචාරක උපදේශකවරුන් 29 දෙනෙකුට ආරාධනා කරන ලදී.
- 2020 පළමු කාර්තුවේදී ශ්‍රී ලංකාව පවුල් හිතකාමී ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා VBP විසින් ප්‍රථම පවුලේ සංචාරක බ්ලොග්කරුවන්ගේ කණ්ඩායමට සත්කාරකත්වය සපයන ලදී. ප්‍රසිද්ධියෙන් අඩු ප්‍රදේශ වන විලච්, යාපනය, ගම්පහ දිස්ත්‍රික්කය, මාතලේ, බෙලිහුල් ඔය සහ තවත් බොහෝ ප්‍රදේශ සමාජ මාධ්‍ය සඳහා විවිධ බ්ලොග් අන්තර්ගතයන් නිර්මාණය කිරීමෙන් ප්‍රවර්ධනය කරන ලදි.
- මීට අමතරව, අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ VBP වැඩසටහන මගින් "Keep Sri Lankan Dream Alive" නමින් සංචාරක බලපෑම් ව්‍යාපාරයක් සංවිධානය කරන ලදී. මෙම ව්‍යාපාරය ජනප්‍රිය සමාජ මාධ්‍ය වේදිකා තුළ ගමනාන්තයේ දෘශ්‍යතාව වැඩි කරනු ඇතැයි අපේක්ෂා කරන ලදි.

## ජනමාධ්‍යවේදී චාරිකා වැඩසටහන (VJP)

ආගන්තුක මාධ්‍යවේදී වැඩසටහන යටතේ 2020 වසරේ මුල් කාර්තුවේදී ශ්‍රී ලංකාවේ පවත්වන ලද මාධ්‍ය වැඩසටහන සඳහා මාධ්‍යවේදීන් 10 දෙනෙකුට සත්කාරකත්වය සපයන ලදී. එක්සත් රාජධානියේ ප්‍රමුඛතම රූපවාහිනී නාලිකාවක් වන ITV හි විකාශනය වන දෛනික උදෑසන වැඩසටහනක් වන "This Morning Show" වැඩසටහන් මාලාවට 2020 ජනවාරි 5 සිට 11 දක්වා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට ආරාධනා කරන ලදී. මීට අමතරව ජර්මනියේ ඩොක්මා ටීවී සහ දකුණු කොරියාවේ සංචාරක සඟරාවෙන් 2020 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණියේය.

## මුද්‍රිත මාධ්‍ය ප්‍රචාරණය

රටවල් 10 ක ජාත්‍යන්තර මුද්‍රිත සඟරා 22 ක දැන්වීම් ප්‍රචාරණය කරන ලදී. ඒවා නම්,

- ස්වීඩනයː 'වැගබොන්ඩ්' සඟරාව
- ඕස්ට්‍රේලියාවː 'සිග්නේචර් ලක්ෂරි' සංචාරක සඟරාව සහ ජාත්‍යන්තර සංචාරක සඟරාව
- ඉන්දියාවː 'අවුට්ලුක් සඟරාව' සහ 'ඉන්දියා ටුඩේ' සඟරාව
- නෙදර්ලන්තයː 'නැෂනල් ජියෝග්‍රැෆික් ට්‍රැවල්ර් එෂියා' සහ 'ඩවුන් අන්ඩර්' සඟරාව
- එක්සත් රාජධානියː වොන්ඩලස්ට් සඟරාව
- ජර්මනියː 'රෙයිස් ඇන්ඩ් ප්‍රේයිස්' සඟරාව
- ඉතාලියː 'ඩව්' සඟරාව
- මැද පෙරදිගː 'ට්‍රැව්ටෝක් මිඩ්ලීස්ට්' සඟරාව සහ 'DNATA' ලෝක සංචාරක සඟරාව
- රුසියාවː 'නැෂනල් ජියෝග්‍රැෆික් ට්‍රැවල්ර් රෂියා'
- ඇමරිකා එක්සත් ජනපදයː 'AFAR' සඟරාව

## සම්මාන

- ඇමරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානියේ 'කොංඩේ නාස්ට් ට්‍රැවලර්' සඟරාව (Code Nast Traveler Magazine) විසින් පවත්වනු ලැබූ රීඩර්ස් චොයිස් 2020 සම්මාන උළෙලේදී ශ්‍රී ලංකාව ඉතාලියට පසු දෙවන හොඳම ගමනාන්තය ලෙස ශ්‍රේණිගත කළේය.
- මැද පෙරදිග 'කොංඩේ නාස්ට් ට්‍රැවලර්' විසින් 2020 පෙබරවාරි මාසයේදී සංචාරය කළ හැකි හොඳම ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව නම් කරන ලදී
- එක්සත් රාජධානියේ 'ටයිම්ස්' සඟරාව විසින් 2020 සඳහා හොඳම නිවාඩු ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ලැයිස්තුගත කර ඇත
- 2020 දී CNN ට්‍රැවල් හි සංචාරය කළ හැකි හොඳම ස්ථාන 20 අතර ශ්‍රී ලංකාව සිටී
- ලන්ඩනයේ පැවති 'වෝන්ඩර්ලස්ට් ට්‍රැවල්' සම්මාන උළෙලේදී ශ්‍රී ලංකාව "Back on the Map" සම්මානය දිනා ගත්තේය
- ලෝක සංචාර සඳහා සංචාරක කවුන්සිලය මගින් ශ්‍රී ලංකාවට ආරක්ෂිත සංචාරක මුද්‍රාවක් ලැබුණේය.

## ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය නොමිළේ ලද විදේශීය ප්‍රචාරය

- අල්ජසීරා ඉංග්‍රීසි 'Inside Story' වැඩසටහනින්, කොවිඩ්-19න් පසුව සංචාරක කර්මාන්තය නැවත විවෘත කිරීමට ශ්‍රී ලංකාව සූදානම් වන ආකාරය පිළිබඳ තොරතුරු.
- සංචාරක අංශය පුනර්ජීවනය කිරීම සඳහා බීබීසී මාධ්‍ය ජාලය ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සමඟ සහයෝගයෙන් කටයුතු කළ අතර මාසයක් සඳහා නොමිලේ මාධ්‍ය ආවරණය සැපයීය.
- CNN මාධ්‍ය ජාලය මගින් මුදල් අයකිරීමකින් තොරව ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයට නොමිලේ රූපවාහිනී හා ඩිජිටල් මාධ්‍ය ආවරණය සැපයීය.
- CNBC නාලිකාව විසින් සුහද අතහිත දීමක් වශයෙන් මාස 3 ක් නොමිළේ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම.
- යුරෝ ප්‍රවෘත්ති නාලිකාව මගින් සිදුකරනු ලැබූ සංචාරක කටයුතු පිළිබඳ නැවත සිතීම සහ පුනර්ජීවනය (ආසියානු කලාපය) පිළිබඳ මාර්ගගත සාකච්ඡාව
- ඊජිප්තුවේ නයිල් ටීවී - ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය මධ්‍යධරණී සංචාරකයා ආකර්ෂණය කර ගනිමින් සාර්ථකව ගෝලීය වශයෙන් ප්‍රවර්ධන කටයුතු සිදු කරයි.

| මාතෘකාව | මාධ්‍යය | |
|---|---|---|
| සංචාරය කළ යුතු ගමනාන්ත 9ක් | National Geograpic සඟරාව | වනජීවී සම්පත, ත්‍රාසජනක ක්‍රියා, උරුමයන්ගෙන් සහ සංස්කෘතියෙන් පොහොසත්, සියළු දෙයකින් ස්වල්පය බැගින් ඇති ශ්‍රී ලංකාව ,පාරිසරික සංචරණයේ නැග එන තරුව, ලෙස Nat Geo සඟරාව හඳුන්වා දී ඇත. |
| ලෝන්ලි ප්ලැනට් ශ්‍රී ලංකාව | Lonely Planet | ඔබගේ නිවාඩුවේ හිරු එළියෙන් නැහැවුණු සුන්දර වෙරළ තීරයක සැනසෙන්නට, මනස්කාන්ත දසුන් නරඹන දුම්රිය චාරිකාවක යෙදෙන්න, රසවත් තේ කෝප්පයක් තොල ගාන්න, බලන බලන තැන ඉතිහාසය පිළිබඳ කතා දැනගන්නට අවශ්‍ය නම් ආදරණීය ශ්‍රී ලංකාව වෙත සැඟවගන්න. |
| ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට හේතු 23ක් | Daily Telegraph UK | ඔබට ශ්‍රී ලංකාවට යාමට හේතුවක් අවැසි නම් අපට ඒ සඳහා හේතු 23 ක් දිය හැකියි. දිවියන්, අලියන්, කල්මසුන්ගේ සිට, ක්‍රිකට්, කකුළුවන්, ශතක ගණන් දිවෙන ඉතිහාසය මෙන්ම වහා දියුණු වන නවීන මුහුණුවර. ශ්‍රී ලංකාව ඔබට ඒ සියල්ල ලබා දෙයි. |
| ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට සුන්දර හේතු | CNN | ඉතිහාසයේ කවර කලෙක හෝ ශ්‍රී ලංකාවට පැමිණි සෑම ආගන්තුකයාම මේ සුන්දර දිවයින සමග ප්‍රේමයෙන් වෙළී ගිය නිසා මෙයට විවිධ නම් ලවා දුන්නා. |

## MICE (රැස්වීම්, සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන පිළිබඳ) සංචරණය

- ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය විසින් 2020 වර්ෂය සඳහා ඉන්දියාවේ හි පැවැත්වූ බිස්නස් / මයිස් සහ ලෙෂර් ට්‍රැවල් මාර්ට් 2020 (BLTM) පළමු වෙළඳ ප්‍රදර්ශනයට සාර්ථකව සහභාගී විය.
- ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයා සමග ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය ඒකාබද්ධ වී ආසියානු පැසිෆික් රැස්වීම්වලදී (AIME) ශ්‍රී ලංකා මණ්ඩපයක් සාර්ථකව සංවිධානය කළේය.
- ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ ආයතනික MICE වීඩියෝව දියත් කරන ලදී.
- ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම.(www.meetinsrilanka.com)
- MICE පහසුකම් පිළිබඳ විස්තර පහසුවෙන් ලබා ගැනීම සඳහා SLCB ජංගම යෙදුම වැඩි දියුණු කරන ලදි.
- ප්‍රදර්ශන, සම්මේලන ආදිය සඳහා බලපෑම් කළ හැකි පාර්ශවයන් ආකර්ෂණය කර ගැනීම සඳහා තත්පර 30 වීඩියෝ පට 7ක් නිෂ්පාදනය කිරීම.
- දේශීය හා ජාත්‍යන්තර ප්‍රවර්ධන වෙළඳ දැන්වීම් සඳහා නිර්මාණ සකස් කිරීම;
    - සමාජ මාධ්‍ය නිර්මාණ
    - සඟරා සහ පුවත්පත් සඳහා කලා කෘති.
    - ස්ථාවර / පෙනන්ට් කලා කෘති.
    - වෙළඳ ප්‍රදර්ශන, මණ්ඩප කලා කෘති සහ මෝස්තර.
    - ආයතනික ද්‍රව්‍ය හා අත් පත්‍රිකා
- කෝවිඩ් -19- සංචාරක මෙහෙයුම් මාර්ගෝපදේශ පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම.
- මාර්ගගත රැස්වීම්
    - ප්‍රදර්ශන විශේෂඥයින් සහ MICE කටයුතු මාධ්‍ය සඟරාව විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශන, සම්මේලන පිළිබඳ දෙවැනි සම්මන්ත්‍රණය.
    - ITB Asia මාර්ගගත ප්‍රදර්ශනය සහ සමුළුවට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය සහභාගී වීම
- මහජන සෞඛ්‍ය සඳහා ආසියා පැසිෆික් අධ්‍යයන සම්මේලනය (APACPH) 2020 සමුළුව දෙසැම්බර් මාසයේදී පැවැත්වීමේ සංවිධාන කටයුතු.
- හෝටල් හිමියන් සහ සංචාරක කර්මාන්ත සාමාජිකයන් සඳහා කලාපීය MICE පුහුණුව.
- 2020 ඔක්තෝබර් 27 දින පැවති ICCA "ලොව පුරා මිනිත්තු 40 කින්" සැසියෙහි SLCBහි ඉදිරිපත් කිරීම.
- කොළඹ කර්මාන්ත සාමාජිකයින් සඳහා MICE ස්ථාන හුරුපුරුදු කිරීමේ වැඩසටහන.

## ඩුබායි එක්ස්පෝ 2020

ඩුබායි එක්ස්පෝ 2020 රටවල් 192 ක් සහ ලොව පුරා මිලියන 15 ක් නරඹන්නන් ආවරණය කිරීම සඳහා 2020 සැප්තැම්බර් 20 සිට 2021 අප්‍රේල් 20 දක්වා මාස 6 ක කාලයක් තුළ පැවැත්වීමට නියමිතව තිබුණි. ගෝලීය වසංගත තත්ත්වය සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රදර්ශනය 2021 ඔක්තෝබර් 01 සිට 2022 මාර්තු 31 දක්වා කල් තබන ලදී. මෙය ශ්‍රී ලංකාව සඳහා වැදගත් අවස්ථාවක් වන අතර 2018 සිට මෙම උත්සවය සම්බන්ධීකරණය කිරීම සඳහා භාර දී ඇති ප්‍රධාන ආයතනය වන්නේ අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) ය. ඉන්පසු එය 2020 නොවැම්බර් මාසයේ කැබිනට් පත්‍රිකාවක් මගින් ශ්‍රී ලංකා සංචරණය පවරන ලදී. කෝවිඩ්- 19 තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත නරඹන්නන්ගේ සංඛ්‍යාවට සෘණාත්මක බලපෑමක් ඇති වන නමුත්, ශ්‍රී ලංකා සංචාරක අංශය සනිටුහන් කරනුයේ මෙම අවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකාවේ දෘශ්‍යතාව සහතික කිරීම සහ ද්විපාර්ශ්වික සබඳතා ආරක්ෂා කිරීම අරමුණු කරගනිමින් මෙම අවස්ථාවට සහභාගී වීමට ශ්‍රී ලංකා සංචරණය කටයුතු කරන බවයි. කෙසේ වෙතත් සම්පත් හා අරමුදල් සීමා සහිත බැවින් අවම වියදමකින් මෙම කාර්ය සිදු කරනු ඇත.

# 08

## අට වැනි කුළුණ:
## ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් ස්ථානගත කිරීම සහ ප්‍රවර්ධනය



## ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන

වසර 5 ක ගෝලීය සන්නිවේදනයක් සිදු කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 190 ක ඇස්තමේන්තුගත අයවැයක් සහිත ව්‍යාපෘතියට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. කර්මාන්තයේ මන්දගාමිත්වය ,සංචාරක සංවර්ධන බද්ද එකතු කිරීම පහත වැටීම සැලකිල්ලට ගනිමින්, මෙම ආයෝජනය ආරම්භක අවධියේදී නැවත පරිමාණය කල යුතුය.

යෝජිත ව්‍යාපෘතිය ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය නැවත ස්ථානගත කිරීමට සහාය වනු ඇති නිසා එය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට අතිශයින්ම වැදගත් ය. කෝවිඩ්-19 වසංගත තත්වය අනුව කෙටිකාලීන හා මධ්‍ය කාලීනව සංචාරකයන්ගේ සංඛ්‍යාව අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන නිසා මෙම වැඩසටහන මගින් පශ්චාත් කෝවිඩ්-19 සමය තුළදී ශ්‍රී ලංකාවට සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වනු ඇත. මෙමෙ වැඩසටහනේ කොටසක් ලෙස, අපි ත්‍රාසජනක, සුවතාවය (ආයුර්වේද හෙළ වෙදකම ඇතුළුව) සහ රටේ හඳුනාගත් අනෙකුත් ප්‍රධාන විශේෂාංග ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරමු. යෝජිත ප්‍රවර්ධන වැඩසටහන ශ්‍රී ලංකාව ගමනාන්තයක් ලෙස තරඟකාරිත්වය සහතික කිරීම සඳහා තීරණාත්මකවන අතර එය ශ්‍රී ලංකාව නව සාමාන්‍ය යුගයේ සිදුවන සංචරණ තුල ශ්‍රී ලංකාවට සංචාරකයන් අභිමි වීම වලක්වනු ඇත. 2010 සිට ශ්‍රී ලංකාවට ඒකාබද්ධ ගෝලීය ප්‍රවර්ධන වැඩසටහනක් නොතිබුණි. අනෙක් තරඟකාරී රටවල් දැනටමත් ඔවුන්ගේ ගමනාන්ත ප්‍රවර්ධනය කිරීම ආරම්භ කර ඇති නිසා හැකි ඉක්මනින් මෙම වැඩසටහන දියත් කිරීම අත්‍යවශ්‍ය වේ.

මෙය එක්සත් රාජධානිය, ජර්මනිය (ස්විට්සර්ලන්තය සහ ඔස්ට්‍රියාව ආවරණය කරයි) ප්‍රංශය,(බෙල්ජියම, ලක්සම්බර්ග් ආවරණය කරයි), ඉන්දියාව, චීනය, ඕස්ට්‍රේලියාව, රුසියාව සහ GCC (සෞදි අරාබිය, කටාර්, බහරේන්, කුවේට්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕමානය) යන රටවල් සඳහා ගමනාන්ත සම්බන්ධතා සමාගම් අටක් යොදාගන්නා ඒකාබද්ධ වැඩසටහනක් වන අතර,මහජන සම්බන්ධතා සමාගම් අටක් ඇමරිකා එක්සත් ජනපදය, ස්පාඤ්ඤය , ඉතාලිය,ස්කැන්ඩිනේවියාව (ස්වීඩනය, ඩෙන්මාර්කය, නෝර්වේ, ෆින්ලන්තය, ජපානය, කොරියාව පෝලන්තය සහ නෙදර්ලන්තය යන රටවල මහජන සම්බන්ධතා, මාධ්‍ය මිලදී ගැනීම සහ ශ්‍රී ලංකාව දේශීයව නියෝජනය කිරීම වැනි කාර්යයන් ඉටු කිරීම සඳහා යොදාගනු ලැබේ.නිර්මාණාත්මක උපායමාර්ගය, නිර්මාණාත්මක සංවර්ධනය,සහ ව්‍යාපාරයේ අන්තර්ගතය නිර්මාණය කිරීම සඳහා නිර්මාණශීලී සමාගමක් පත් කරනු ඇත. පත් කරන ලද ඩිජිටල් ඒජන්සිය ඩිජිටල් වත්කම් නිර්මාණය කරනු ඇත සහ කාර්යාංශයේ සමාජ ගිණුම් සහ ව්‍යාපාරය කළමනාකරණය කරනු ඇත. ඉහත සඳහන් සියලුම ආයතන දහඅට කළමනාකරණය , ව්‍යාපාර කළමනාකරණ ඒකකයක් හරහා කළමනාකරණය වේ. මෙමෙ වැඩසටහන වලංගු කිරීම සහ අධීක්ෂණය කිරීම ස්වාධීන පර්යේෂණ ආයතනයක් විසින් සිදු කරනු ඇත.

## සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රමෝපායික අලෙවිකරණ සැලැස්මක් ආරම්භ කිරීම සහ සංවර්ධනය කිරීම

ගෝලීය සන්නිවේදනයේ කොටසක් ලෙස උපායමාර්ගික සන්නිවේදන සැලැස්ම සංවර්ධනය වෙමින් පවතී. පළමු අදියරේ ප්‍රසම්පාදන කටයුතු සිදුකෙරෙමින් පවතී.

## දැනට අවසන්ව ඇති කටයුතු

- වැඩසටහන සඳහා කැබිනෙට් මණ්ඩල අනුමැතිය ලැබුණි.
- ගෝලීය සන්නිවේදන ව්‍යාපාර යාන්ත්‍රණය සහ උපාය මාර්ග සංවර්ධනය කරන ලදි.
- මහා භාණ්ඩාගාර අනුමැතිය ලැබුණි.
- නිර්මාණාත්මක, පර්යේෂණ, ඩිජිටල් සහ ප්‍රචාරණ කටයුතු කළමනාකරණ ඒකක සඳහා ප්‍රසම්පාදන ලියවිලි සුදානම් කර ඇත.
- ගමනාන්ත සම්බන්ධතා සමාගම් සහ මහජන සම්බන්ධතා සමාගම් සඳහා ප්‍රසම්පාදන ලියවිලි සුදානම් කර ඇත.
- නිර්මාණාත්මක, ඩිජිටල් සහ ප්‍රචාරණ කටයුතු කළමනාකරණ ඒකක සඳහා තාක්ෂණික කමිටු අනුමැතිය ලැබී ඇත.
- පර්යේෂණ සඳහා තාක්ෂණික කමිටු අනුමැතිය අපේක්ෂිතයි.

# 09

## නව වැනි කුළුණ:
## යටිතල පහසුකම් හා සේවා



## සංචාරක කර්මාන්තයේ ආයෝජන වැඩි කරමින් කර්මාන්තය දියුණු කිරීමට පහසුකම් සැළසීම

- සංචාරක ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලියේ අවශ්‍ය සියළුම රේඛීය ආයතන ආවරණය වන පරිදි ඒකාබද්ධ පොදු අයදුම්පතක් සකස් කොට ඇති අතර, එමගින් ආයෝජකයාගේ හා ආයතනයන්හි කාලය සහ ශ්‍රමය ඉතිරි කරගත හැක.
- 2020 වසරේ මේ දක්වා කාලය තුළ සංචාරක කර්මාන්තය සඳහා විදේශීය ආයෝජන 2019 වසරේ පැවති ඇ.ඩො. මිලියන 190 ට සාපේක්ෂව ඇ.ඩො. මිලියන 835ක් දක්වා වර්ධනය වී ඇත. (මෙයට ඇමරිකානු ඩොලර් මිලියන 600 ක වටිනාකමකින් යුත් එක් ව්‍යාපෘතියක් ඇතුළත් වේ).

සංචාරක ව්‍යාපෘතියක ආයෝජනය සඳහා සාමාන්‍යයෙන් ආයතන 15 ත් 25 ත් අතර ප්‍රමාණයක අනුමැතිය අවශ්‍ය වන නිසා අන්තර්ජාතික හා දේශීය ආයෝජකයින් විසින් අනුමත කළ දින සිට ක්‍රියා පටිපාටි ඉතා ව්‍යාකූල විය. එවැනි ව්‍යාපෘති අනුමත කරන ආයතන 43 ක් ලැයිස්තුගත කර ඇත.

මෙම දිගුකාලීන ගැටළුව විසඳීමට වෘත්තීමය වශයෙන් නිර්මාණය කරන ලද, පුළුල් වූ තනි කවුළු පද්ධතියක් හඳුන්වා දෙන ලද අතර එමගින් දැනටමත් සංචාරක ආයෝජන අනුමත කිරීම් 340% කින් වැඩි වී ඇත. (ඉහළ වටිනාකමකින් යුත් තනි ව්‍යාපෘතියක් ඇතුළුව. එම ව්‍යාපෘතිය බැහැර කලද පෙර වසරට සාපේක්ෂව 24% ක වර්ධනයක් පිළිබිඹු කරයි). ආයෝජකයින් තනි අයදුම්පතක් යොමුකරන නිසා අපට වෙනත් ආයතන සමඟ සියලු අනුමත කිරීම් ඵලදායී ලෙස සම්බන්ධීකරණය කළ හැකිය. අන්තර් නියෝජිත සම්බන්ධීකරණය හා අනුමත කිරීම් ස්වයංක්‍රීය කිරීම සඳහා මෘදුකාංගයක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය මේ වනවිට සිදුකරමින් පවතී.

## සංචාරක ව්‍යාපෘති සඳහා සංචාරක සංවර්ධනය, නව ඉඩම් සහ කල්බදු

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් මන්නාරම් ප්‍රදේශයේ සහ යාපනයේ ඩෙල්ෆ්ට් දූපතේ සුදුසු ඉඩම් හඳුනා ගැනීමෙන් දිවයිනේ උතුරු කොටස ආවරණය වන පරිදි නව තේමා නිකේතන සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරන ලදී. ඉඩම් අත්පත් කර ගැනීම /පවරා ගැනීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතින අතර මෙම නව යෝජිත නිකේතනවල අරමුණ සංචාරක මාර්ග පුළුල් කිරීම, සංචාරකයින්ට කලාපයේ ආකර්ශන සහ සංස්කෘතික අත්දැකීම් ලබා ගැනීම සඳහා සංචාරක යටිතල පහසුකම් වැඩි කිරීමයි . මේවායින් වැඩි පිරිසකට සංචාරක කර්මාන්තයේ ක්‍රියාකාරීව නිරත වීමට සාධාරණ අවස්ථා ලබා දෙනු ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නාගරික සංවර්ධන අධිකාරියේ සහයෝගයෙන් ඇල්ල සහ ආරුගම්බේ සඳහා සංචාරක කලාපකරණ සැලසුම් සකස් කිරීම සම්පූර්ණ කරන ලදී. නුවරඑළිය සඳහා කලාපකරණ සැලැස්ම ක්‍රියාත්මක වෙමින් පවතී. සම්පූර්ණ කරන ලද කලාපකරණ සැලසුම් නුදුරු අනාගතයේදී ගැසට් කරනු ලැබේ.

නිසි ක්‍රියා පටිපාටීන් අනුගමනය කරමින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් කල්පිටිය, කුච්චවේලි සහ බෙන්තොට ඉඩම් ඇමරිකානු ඩොලර් මිලියන 478ක වටිනාකමකින් යුතු නව ව්‍යාපෘති සඳහා අනාගත ආයෝජකයින්ට බදු දීමට අවශ්‍ය අනුමැතිය ලබාගත් අතර එමගින් නව කාමර 1600 ක් එකතු කරනු ඇත.

## ආයෝජක අත්පොත

මාර්ගෝපදේශයක් ලෙස මෙන්ම පොදු අයදුම්පත පුරවා සංචාරක අදහස් ගෙන ඒම සඳහා මග පෙන්වීමක් ලෙස විධිමත් යාන්ත්‍රණය අනුමත කිරීම පිළිබඳ අවශ්‍යතා ඇතුළු සියලු තොරතුරු සුහද හා සරල ආකාරයකින් දක්වා ඇති ආයෝජක අත්පොතක් හඳුන්වා දෙන ලදී. අත්පොත පූර්ව අයදුම්පත් රැස්වීමේ සිට අවසාන අනුමැතිය දක්වා සම්පූර්ණ අනුමත ක්‍රියාවලිය ආවරණය කරයි. එය ශ්‍රී ලංකාවේ සුවිශේෂී වාස්තු විද්‍යාත්මක සම්ප්‍රදායන්, අද්විතීය සංස්කෘතික උරුමයන් සහ ස්වාභාවික සම්පත් මත පදනම් වූ නිර්මාණ අදහස් සපයයි.

## ශ්‍රී ලංකාවේ නව සංචාරක සංවර්ධනය සඳහා සැලසුම් මාර්ගෝපදේශ

හරිත ගොඩනැගිලි සංකල්පය හැකි උපරිමයට අනුගත කරමින් රටේ සියළුම සංවර්ධන මාර්ගෝපදේශයන්ට අනුකූලව ව්‍යාපෘති සැලසුම් කිරීමට ආයෝජකයින්ට උපකාර කිරීම සඳහා මාර්ගෝපදේශයක් සකස් කරන ලදී. මෙහි තවත් වැදගත් පරමාර්ථයක් වනුයේ ශ්‍රී ලංකාවට ආවේණික වූ ,අදාළ ප්‍රදේශ සඳහා වඩාත් සුදුසු නිර්මාණ සැලසුම් සඳහා නව සංචාරක සංවර්ධනයන් දිරිමත් කිරීමයි. නීති රීති පැනවීමෙන් බැහැරව, මෙම ආකාරයේ නිර්මාණ මාර්ගෝපදේශයක් හඳුන්වා දුන් පළමු අවස්ථාව මෙය විය. මෙම ලේඛනයේ ආරම්භක දළ සටහන සහ පළමු පරිච්ඡේද කිහිපයක් සම්පූර්ණ කර ඇති අතර නාගරික සංවර්ධන අධිකාරිය, ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය, ඉංජිනේරු ආයතනය වැනි සියලුම වෘත්තීය ආයතනවල අදහස් ලබා ගැනීමෙන් පසු එය හැකි ඉක්මනින් අවසන් කිරීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකාවේ ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය නැවත සැලසුම් කිරීම සඳහා සහාය වීම සඳහා වන USAID හි (SAIL) ව්‍යාපෘතිය යටතේ මෙම කාර්යය සිදු කරන ලදී.

## අන්තර් ආයතනික සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම

ආයතන දෙක අතර සහයෝගිතාවය වැඩි දියුණු කිරීම සහ ආයෝජකයින්ගේ කාලය හා පිරිවැය අඩු කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ආයෝජන මණ්ඩලය අතර 2020 පෙබරවාරි 10 වන දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

මීට පෙර සංචාරක සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමගද අවබෝධතා ගිවිසුම් වලට එළඹී ඇත.

### සමාජීය හා ආර්ථික බලපෑම:

- සංචාරක අංශයේ දේශීය හා විදේශීය සෘජු ආයෝජන වැඩි කිරීම හා කඩිනම් කිරීම.
- උසස් තත්ත්වයේ, තිරසාර හෝටල් සහ සංචාරක සේවා පිහිටුවීමට දිරි දීමනා.
- අක්‍රමිකතා අඩු කිරීම.
- රැකියා උත්පාදනය.
- තිරසාර පාරිසරික කළමනාකරණය.

# 10

## දස වැනි කුළුණ:
## පාර්ශවකාරකම්



## විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමග සමීපව කටයුතු කිරීම

ශ්‍රී ලංකාව ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සමඟ සමීපව සහයෝගයෙන් කටයුතුකෙරේ. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ ධූත මෙහෙවර සමග විශේෂිත මාර්ගගත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර ගෝලීය ප්‍රවර්ධන වැඩසටහනේ කොටසක් ලෙස ප්‍රධාන සංචාරක වෙළඳපොළවල් සඳහා ගමනාන්ත නියෝජිත සහ මහජන සබඳතා ආයතන පත් කිරීමට සැලසුම් සකස් කරන ලදී. මෙම ආයතන ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සමඟ කටයුතු කරනු ඇත. තවද,අදාළ දූත මණ්ඩල සමග එක්ව ඉදිරියේදී එක්ස්පෝ 2020 ඩුබායි වැනි ජාත්‍යන්තර උත්සව සංවිධානය කරනු ඇත.

## ජාත්‍යන්තර සංවිධාන සමග කටයුතු කිරීම

යාවත්කාලීන දැනුමෙන් පිරිපුන් මානව සම්පත ආයතනය තුළින් සොයාගැනීමට අපොහොසත් වන අවස්ථාවන්හිදී විශේෂිත වූ ජාත්‍යන්තර ආයතන හරහා එම හිදැස සම්පූර්ණ කරගැනීමට හැකිවූ බව ස්තුතිපූර්වකව සිහිකරමු. මෙහිදී ඔස්ට්‍රේලියානු රජයේ ආධාරයෙන් MDF ආයතනය, Australia Skills Development , ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, USAID SAIL , යුරෝපා සංගමය, ITC (International Trade Center), S4IG Australiaයන ආයතන දැක්වූ සහයෝගය ඇගයීමට ලක් කරමු.

## අන්තර් අමාත්‍යංශයීය සහයෝගය

- සංචාරක හිතකාමී ප්‍රතිපත්ති සහතික කිරීම සඳහා අනෙකුත් අමාත්‍යංශ හා ආයතන සමඟ සමීපව කටයුතු කිරීම ඉතා වැදගත්ය
- සංචාරක ව්‍යාපාරය ඩිජිටල්කරණය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතන සමග කටයුතු කිරීම.
- CCF- සිගිරිය තිරසාර ගමනාන්තයක් ලෙස ගොඩනැගීම සහ සංචාරක ජංගම යෙදුමෙන් මාර්ගගත ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීම
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව - -තිරසාර සංචාරක ගමනාන්ත සහ සංචාරක ජංගම යෙදුමේ මාර්ගගත ප්‍රවේශ පත්‍ර
- දුම්රිය මාර්ග -- සමහර මැදිරි පළමු පන්තියට උසස් කිරීම, ජනප්‍රිය දුම්රිය ස්ථාන වැඩිදියුණු කිරීම සහ සංචාරක යෙදුමෙන් මාර්ගගත ටිකට්පත් මිලදී ගැනීම
- කටුනායක ගුවන් තොටුපලේ සිට දුම්රිය සම්බන්ධතාවය
- නිර්දේශිත සහ ඉහලම ජාත්තාන්තර අනුකූලතා වලට අනුව තල්මසුන් නැරඹීම
- පරිසරයට හානියක් නොවන පරිදි වගකීමක් ඇතුව සංවර්ධනය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සහ නාගරික සංවර්ධන අධිකාරිය සමඟ මධ්‍යගත සැලසුම් සකස් කිරීම.
- සංචාරක කලාප පුළුල් කිරීම
- ශ්‍රී ලංකා පොලිසිය මගින් සංචාරක පොලිසියේ පරාසය හා ධාරිතාව පුළුල් කිරීම
- සාගර පාරිසරික ආරක්ෂාව පිළිබඳ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය කටයුතු කිරීම

## සහයෝගීතාවය සහ හවුල්කාරිත්වය

- අළෙවිකරණ ව්‍යාපාර හා සංවාද ගොඩනැගීම සඳහා සියලුම ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා සහයෝගීතාවයෙන් පරීක්ෂණාත්මකව ඉදිරිපත් කරනු ලබන විද්‍යාත්මක හා පරිපූර්ණ ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලවලින් යෝජනා ලබා ගැනීම.
- සංචාරක ක්‍රියාකරුවන්, ක්‍රෙඩිට් කාඩ් සමාගම්, මාර්ගගත සංචාරක නියෝජිතයින්, ගුවන් සමාගම් සහ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයට ඵලදායී පිරිවැයකින් සහාය වන ඕනෑම හවුල්කරුවෙකු සමඟ අපි සහයෝගීව කටයුතු කරන්නෙමු.

# නිගමනය

පශ්චාත් කෝවිඩ් 19 නැවත ගොඩනැගීමේ උපායමාර්ගයන්හි පහත කරුණු ඇතුළත් වීම සුදුසුය;

- දැනටමත් ආරම්භ කර ඇති සහන වැඩසටහන් හරහා සංචාරක ව්‍යාපාර සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අඛණ්ඩව සහයෝගය ලබා දීම.
- ගුවන් තොටුපල විවෘත කිරීමේ උපායමාර්ගය සවිස්තරාත්මක ප්‍රොටෝකෝලයක් සහිතව සැලසුම් කර ඇත
- දේශීය සංචරණ වැඩි කිරීම සඳහා වන දේශීය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- හෝටල් සහ අනෙකුත් නවාතැන් සපයන්නන්ට ආරක්ෂිත සහ සුරක්ෂිත සහතික පත්‍ර ප්‍රදානය කිරීම
- ආයුර්වේද හා හෙළ වෙදකම මාර්ගයෙන් සුවතා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම
- 2021 සිට ගෝලීය අලෙවිකරණ වැඩසටහන සඳහා සූදානම් වීම
- ගෝලීය ප්‍රවර්ධන උපාය මාර්ග සම්පාදනය කිරීම

සංචාරක ආකෘතීන් වෙනස් වීම කොවිඩ් -19 සෞඛ්‍ය වසංගතයට පෙර ආරම්භ වූ අතර මෙරටට පැමිණෙන සංචාරකයින් බොහෝවිට නව අත්දැකීම් සහ ප්‍රජා සම්බන්ධතාවයන් පිළිබඳ වැඩි අවධානයක් දැක්වීමට පෙළඹී ඇත. අන්තර්ජාලයේ සහ සමාජ මාධ්‍යවල වර්ධනය හේතුවෙන් ඔන්ලයින් සංචාරක ඒජන්සි, සංචාරක ව්‍යාපාරය තුළ ඔන්ලයින් සංචාරක ඒජන්සි බහුල වී ඇති අතර, තාක්ෂණය භාවිතයෙන් සමීක්ෂණ හරහා සංචාරකයන්ගේ රුචිකත්වය අනුව නවමු මෙන්ම ත්‍රාසජනක අත්දැකීම් සොයන සංචාරකයින්ගේ ඉල්ලුමට ගැලපෙන පරිදි සංචාරක ගමන් සැළසුම් කරයි.

කොවිඩ් 19න් පසු සාම්ප්‍රදායිකව ක්‍රියාත්මක වූ වැඩි පුද්ගලයන් පිරිසක් ගෙන්වීම සඳහා වන සංචාරක ආකෘතියට තවදුරටත් බලපෑම් ඇති වී තිබේ. දේශීය අත්දැකීම් සංචාරකයා සමඟ බෙදා ගැනීමට ප්‍රජා පාදක සංචාරක ව්‍යාපාරය හරහා සංචාරකයන්ට දේශීය අත්දැකීම් බෙදා ගැනීමට, ප්‍රාදේශීය ප්‍රජාවන් අතර ගැවසීමට අවස්ථාවක් සහ ප්‍රජාවන්ට වැඩි ආදායම් මාර්ගයක් නිර්මාණය වී ඇත.

නව සහස්‍රයේ උපන් පිරිසෙන් වැඩි දෙනෙක් අද්විතීය අත්දැකීම් සොයා යෑමට රුචියක් දක්වති. මෙම නැගී එන ප්‍රවණතාවයට සමගාමීව අත්දැකීම් ඇතුළත් කිරීම සහ සේවා ගුණාත්මක මට්ටම ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන උපාය මාර්ගික වෙනස්කම් ද සිදු කරනු ඇත. සංචාරක කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා සංචරණ ආයතනය දේශීය විශ්ව විද්‍යාල සහ විදේශ සංවර්ධන හවුල්කරුවන් සමඟ අත්වැල් බැඳගනු ඇත.

එබැවින්, ජාතිකත්වය මතම පදනම්ව නොවී, ත්‍රාසජනක අත්දැකීම්, වනජීවී, ස්වස්ථාව, විවිධ සංස්කෘතීන්, දේශීය ආහාර යනාදී විවිධ අත්දැකීම් අනුව ඛණ්ඩිත වෙළඳපොලක් සහිත ගමනාන්ත සන්නාමයක් (destination branding) කෙරෙහි අප යොමු විය යුතුය. මෙම වසංගතයෙන් පසුව, ඩිජිටල් හා විද්‍යුත් මාධ්‍ය හරහා පාරිභෝගිකයා වෙත ලංවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු අතර එමගින් සංචාරකයින් සොයනු ලබන්නේ කවරාකාර අතදැකීම්දැයි සොයා බලා, එලෙස හඳුනාගන්නා රුචි අරුචිකම් අනුව අපගේ සංචාරක සේවා සැපයීම ගැලපීම තුළින් අපට වැඩි ආදායමක් ඉපදවිය හැකි අතර, ග්‍රාමීය හා දුර බැහැර ප්‍රදේශවල ජනතාවට වැඩි ආර්ථික ප්‍රතිලාභ ලබා දිය හැක.

සියළු පාර්ශවකරුවන්ගේ හා ජනතාවගේ සහයෝගයෙන් සහ ආශීර්වාදය යටතේ ශ්‍රී ලංකාවට සංචාරක ක්ෂේත්‍රයේ සැළකිය යුතු සාර්ථකත්වයක් අත් කරගත හැක.



**සංචාරක අමාත්‍යාංශය**

**සහ**

**ශ්‍රී ලංකා සංචරණය**

2020 දෙසැම්බර්